

වාර්ෂික වාර්තාව 2019

නො. 415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.
දුරකථන : +94 11 2668800 ෆැක්ස් : +94 11 2687369
විද්‍යුත් තැපෑල : bpu@cecb.lk

# වාර්ෂික වාර්තාව 2019

www.cecb.lk

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

# වාර්ෂික වාර්තාව 2019

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

www.cecb.lk

වාරිමාර්ග අමාත්‍යාංශය
අංක 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව

# පටුන


| | |
|---|---|
| අපගේ තොරතුරු | 01 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 03 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය | 04 |
| මූල්‍යමය විශේෂතා | 05-06 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 07-08 |
| CECB හි කළමනාකරණ කණ්ඩායම | 09 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 10-11 |
| විගණන කමිටු වාර්තාව | 12-13 |
| ඒකාබද්ධ තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති | 14-23 |
| මූල්‍ය ප්‍රකාශන | |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 24 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 25 |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 26 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 27 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 28-38 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 39-47 |
| සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශන | 48-49 |
| CECB කාර්ය සාධනය | 50-58 |
| මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම - මඉසේස | 59-64 |

# ප්‍රබෝධයෙන් ඉලක්ක අභිබවා යමු

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) ක්‍රියාකාරිත්වයෙන් බහු ආයතනික වූ ද , ප්‍රවේශයෙන් පුරෝගාමී වූ ද ඒ සියල්ලට ඉහළින් ඉදිරියට යාමේ අභිලාශයෙන් යුත් අභිප්‍රේරිත වෘත්තිකයන් කණ්ඩායමකින් සැදුම් ලත් වත්මන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉංජිනේරු උපදේශන සේවා සපයන ආයතනයයි.

එම අභිප්‍රේරණය අතීතයක් සමඟ පැමිණෙන්නකි - එය දශක දෙකකටත් වඩා පෙර සිට මෙම දිවයිනෙහි මුහුණත නොමැකෙන සලකුණු රාශියක් සටහන් තැබූ අතීතයකි. එම අතීතය, වර්තමාන සංවර්ධිත ලෝකය ආරම්භ වීමට පෙර වැජඹුණු අතීතයකි.

වාසනාවකට, එම නොමැකෙන සලකුණු - එම දුරාතීතයේ දක්ෂ ඉන්ජිනේරුමය වික්‍රමයන් - ජීවය රහිත මෙවලම් මෙන් නොව අප ශරීරයේ දිව යන්නක් ලෙසින් ද, අපව පෝෂණය කරමින් ද, අපගේ ආත්මයන්ට ජීවය ලබා දෙමින් ද තවමත් අප සමඟ පවතී. තව ද, එමඟින් අප විසින් තෝරා ගෙන ඇති පුරුෂයන්ගේ හා කාන්තාවන්ගේ අභිප්‍රේරණය වර්ධනය කරනු ලබයි.

එවැනි අභිප්‍රේරණයන්ට CECB හි දී අපි ජීවය ලබා දෙන්නෙමු.

## අපගේ දැක්ම

ජාත්‍යන්තර තලයේ ඉංජිනේරු
සේවා ආයතනයක් බවට පත්වීම

## අපගේ මෙහෙවර

මිනිස් සංහතියේ සුභසිද්ධිය සඳහා සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගන්නා වූ ද, ඉංජිනේරු විද්‍යා, ගෘහ නිර්මාණ ශිල්ප, හා ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයන් හි නවීනතම තාක්ෂණය භාවිතා කරන්නා වූ ද, තම සේවාවන් සඳහා නිසි ඇගයීම් ලබමින් මැනවින් අභිප්‍රේරණය වූ කාර්ය මණ්ඩලයකින් සමන්විත වූ ද ජාත්‍යන්තර තලයේ ඉංජිනේරු ආයතනයක් බවට පත්වීම





# සභාපතිතුමාගේ පණිවුඩය

2019 මූල්‍ය වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද මහත් වූ භාග්‍යයක් සේ සලකමි.

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයත් 2019 අගෝස්තු මස ජනාධිපතිවරණය තෙක් දේශපාලන වශයෙන් පැවති අවිනිශ්චිත කාලපරිච්ඡේදයත් හේතුවෙන් මෙම වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් පීඩාවට පත් විය. අත්විඳීමට සිදු වූ මන්දගාමී වූ ව්‍යාපාරික පරිසරය සහ අවම ඉදිකිරීම් ව්‍යාපාර පරිමාවන් හමුවේ වුව ද ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ කාර්ය සාධනය ඒකාග්‍රතාවයෙන් යුක්තව පැවතීම පිළිබඳව සටහන් කිරීමට මම සතුටු වෙමි.

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය ක්‍රියාත්මක වූ සාර්ව ආර්ථික පරිසරය සම්බන්ධයෙන් ගත් කල, 2019 මහ බැංකු වාර්ෂික වාර්තාව මඟින් වසර තුළ 2.3% ක මන්දගාමී ආර්ථික වර්ධනයක් වාර්තා කරයි. කෙසේ වෙතත්, 2018 දී වාර්තා වූ 2.5% ක පහත වැටීමට එදිරි ව යමින් ජාතික ඉදිකිරීම් කටයුතු 4.0% ක වර්ධනයක් පෙන්නුම් කළේය. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයේ ප්‍රධාන ධාවකයක් වූ ඉදිකිරීම් අංශය 2019 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 6.9% ක කොටසක් දරා ඇත. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණ පැවතීම මත ආනයනික ගොඩනැගිලි ද්‍රව්‍ය කෙරෙහි දිගින් දිගටම ඍණාත්මක බලපෑමක් ඇති කළේය. කෙසේ වෙතත්, ධනාත්මක වශයෙන් VAT බදු අඩු කිරීම්, ආදායම් බදු අනුපාත සහ ජාතිය ගොඩනැගීමේ බද්ද සහ ආර්ථික සේවා ගාස්තු (ESC) අහෝසි කිරීම යනාදිය ව්‍යාපාර සුහවාදී වීමට හේතු විය. පොලී අනුපාත අඩු කිරීම නිසාවෙන් ඉදිකිරීම් කටයුතු දිරිමත් වූ අතර ම, කාර්යාංශයට එකතු වන මූල්‍ය ආදායම කෙරෙහි ද එය අහිතකර ලෙස බලපෑ අතර ආයෝජන විවිධාංගීකරණයේ අවශ්‍යතාවය සලකා බැලීම සඳහා යොමු වීමට ද හේතු විය.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මෙම මන්දගාමීත්වය නොතකා, 2018 වසරේ ලබාගත් රුපියල් බිලියන 14.3 හා සසඳන විට රුපියල් බිලියන 13.1ක සමූහ ආදායමක් ලබා ගැනීමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමත් වූ අතර 2019 වර්ෂයේදී රුපියල් මිලියන 546.8 ක බද්දට පෙර ලාභයක් (PBT) සාක්ෂාත් කර ගැනීමට ප්‍රධාන වශයෙන් ආදායම අඩුවීම මෙන් ම විකුණුම් පිරිවැය වැඩි වීම හේතු විය. රජය සතු ව්‍යාපාරයක් ලෙස, අපි සියලු නියාමන අවශ්‍යතා දැඩි ලෙස පිළිපදින අතර ඒවාට අනුකූලව කටයුතු කරන්නෙමු. සමුච්චිත බදු සහ අනෙකුත් අයකිරීම් වශයෙන් රුපියල් මිලියන 201.4ක් රජය වෙත ප්‍රේෂණය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ මග පෙන්වීම් සමඟින් වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව තක්සේරු කෙරෙන්න වූ ශක්තිමත් පාලන සහ අධීක්ෂණ යාන්ත්‍රණ සැකසීම තුළින් පාලනය සහ වගවීමේ ගැටළු වැඩිදියුණු කිරීමට නව ප්‍රයත්නයන් ගන්නා ලදී.

ආර්ථික වර්ධනය සහතික කිරීම සඳහා, අනෙකුත් ජාතික නිෂ්පාදන අංශ සඳහා අත්‍යවශ්‍ය අගය දාම ආදානයන් ලෙස සේවය කරන ජාතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී රජය, එහි අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු යනාදිය CECB උපදේශන සහ ඉදිකිරීම් සේවා ලබා ගැනීමේ විශාලතම ගනුදෙනුකරුවන් ලෙස දිගටම රැඳී සිටියි. කෙසේ වෙතත්, රජයේ ව්‍යාපෘතිවල බේරුම්කරණයන්හි දී අත්විඳින ලද දිගු ප්‍රමාදයන් නිසා මූල්‍ය බාධාවන් මතු වූ අතර එය CECB වර්ධන වේගයට බලපෑම් ඇති කරන ලදී. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා සිදුකරමින් පවතී.

CECB ශ්‍රී ලංකාවේ ඉංජිනේරු උපදේශන වෙළඳපල පෙරගමන්කරුවෙකු ලෙස අඛණ්ඩව කටයුතු කරන අතර ම ජාතික සංවර්ධන ප්‍රවාහයට සහය දැක්වීම සඳහා CECB සම්පූර්ණයෙන් ම සන්නද්ධව සහ සූදානමින් සිටින බව මම විශ්වාස කරමි.

ඉංජිනේරු ව්‍යාපෘති සඳහා විවෘත වෙළඳපොළ තුල එලදායී ලෙස සහභාගී වීම සඳහා CECB හි වාණිජමය අරමුණු සහිත ඉදිකිරීම් අංශය ලෙසින් මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම (CESL) වෙළඳපොළ තුළ ස්ථානගත කර ඇත.

අවසාන වශයෙන්, සමාලෝචිත කාල සීමාව තුළ සභාපතිවරයා වූ ඉංජි.ජී.ඩී.ඒ පියතිලක මහතා සහ ඔහුගේ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ වටිනා නායකත්වය වෙනුවෙන් මගේ කෘතඥතාව පළ කරමි. 2019 වර්ෂයේදී කාර්යාංශයේ හිටපු සාමාන්‍යාධිකාරීවරුන් ලෙස කේ.එල්.එස්. සහබන්දු සහ ඉංජි. ටී.ඩී. වික්‍රමරත්න මහත්වරුන් දැක් වූ සහයෝගය, උපදෙස් සහ මග පෙන්වීම වෙනුවෙන් ද ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කැපවීම වෙනුවෙන් ද සියල්ලටත් වඩා අපගේ විශාලතම සම්පත වන අපගේ කාර්ය මණ්ඩලය වෙත ද මාගේ විශේෂ ස්තුතිය පුද කර සිටිමි.



සභාපති
ඉංජි. අයිවන් ද සිල්වා මහතා
B. Sc. (Eng.), M. Eng. Sc. (Const. Mgt), C. Eng.



# සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය

2019 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය ලබා දීමට සතුටු වෙමි.

ස්වයං-මූල්‍ය රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වසර 45 කට වැඩි කාලයක් පුරා ජාතියට සේවය කරන ප්‍රමුඛත ම බහුවිධ ඉංජිනේරු උපදේශන ආයතනය ලෙස තම කීර්තිය ගොඩනගා ගෙන ඇත. CECB හි පූර්ණ අනුබද්ධිත මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම (CESL) බොහෝ තරඟකාරී ලංසු තැබීමේ ව්‍යාපෘති සඳහා සක්‍රියව දායක වෙමින් සමූහයේ ඉදිකිරීම් අංශය ලෙස එහි ස්ථානය තහවුරු කර ගැනීමට සමත් වී ඇත.

සභාපතිවරයා සිය සමාලෝචනයේදී සඳහන් කළ පරිදි 2019 වසර අභියෝගාත්මක වුව ද, ඉදිකිරීම් සහ උපදේශන අංශයෙන් පිළිවෙළින් රුපියල් බිලියන 10.75 ක් සහ රුපියල් බිලියන 2.40 ක් දායකත්වය දක්වමින්, 2018 දී රු.බිලියන 14 ක් වූ CECB සමූහ ආදායම සාපේක්ෂ ව රු. බිලියන 13 ක් ලෙස පවත්වා ගැනීමට සමත් විය. සමූහ ආදායමේ 8% ක අඩුවීමක් තිබියදීත්, CECB සියයට 10 ක දළ ලාභ ආන්තිකයක් සහ රුපියල් මිලියන 85 ක මෙහෙයුම් ලාභයක් ලබා ගත්තේය. බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 547 ක් පසුව වාර්තා විය.

මධ්‍යම හා දක්ෂිණ අධිවේගී මාර්ග, මාතර - කතරගම දුම්රිය දිගුව, වරාය නගර ව්‍යාපෘතිය, ජල සම්පත් සහ කළුගඟ, උමා ඔය සහ බ්‍රෝඩ්ලන්ඩ් යනා දී ජල විදුලි ව්‍යාපෘති වැනි ජාතික වශයෙන් වැදගත් වන සමාජ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අගය ඉංජිනේරු උපදේශන (value engineering consultancies) හරහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් මෙම වර්ෂය තුළ දී ජාතික ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලදී.

මානව ප්‍රාග්ධනය සඳහා වන ආයෝජනය අපගේ ආයතනයේ සංවර්ධනයට මෙන් ම අභියෝගාත්මක වෙළෙඳ පොළ පරිසරයක් තුළ වසර ගණනාවක් රැඳී සිටීමට හේතු වූ ප්‍රධාන සාධකය වේ. 2019 වසර තුළ දී, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් විදේශීය පුහුණු අවශ්‍යතා ඇතුළු ව අභ්‍යන්තර, පශ්චාත් උපාධි, වෘත්තීය සමාලෝචන පුහුණුව සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 14.5ක් ආයෝජනය කරන ලදී. ඔවුන්ගේ CECB වෘත්තීය ජීවිතය තුළ පුද්ගලික වර්ධනය සඳහා අවස්ථා සහතික කරන අතර ම ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අපි දිගටම ආයෝජනය කරන්නෙමු. විශ්වවිද්‍යාල 03 කින් සහ කාර්මික/වෘත්තීය පුහුණු ආයතන 172 කින් සිසුන් 114 දෙනෙකු සඳහා කාර්මික පුහුණු ස්ථානගත කිරීම් නොමිලේ ලබා දීම හරහා CECB ජාතික ඉංජිනේරු අධ්‍යාපනයට ද දායක විය.

වර්තමාන තරඟකාරී පරිසරය තුළ, අපි මානව සම්පතෙහි ගුණාත්මකභාවය, ලාභදායිත්වය, තිරසාරභාවය සහ සංවර්ධනය කෙරෙහි අපගේ අවධානය යොමු කරමින් සිටිමු. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය(CIDA) සමඟ එක් ව ඉංජිනේරු අංශය සඳහා ජාතික ප්‍රමිතීන් සහ පිරිවිතරයන් සහ තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණයන් සංවර්ධනය කිරීමට CECB ක්‍රියාකාරී ව දායක වේ.

අපගේ වර්ධනය සහ සාර්ථකත්වය උදෙසා හවුල් වෙමින් අප කෙරෙහි අඛණ්ඩ විශ්වාසය සහ සහයෝගය දැක්වූ අපගේ සියලූ ම වටිනා සේවාදායකයින්ට ස්තූතිය පළ කරමින් මෙම සටහන අවසන් කිරීමට මට අවස්ථාව ලබා දෙන්න.

මගේ පූර්වගාමීන් වන ඉංජි.කේ.එල්.එස්. සහබන්දු සහ ඉංජි. ටී.ඩී. වික්‍රමරත්න හිටපු සාමාන්‍යාධිකාරීවරුන් හා 2019 වසර තුළදී කාර්යාංශයේ හිටපු සභාපතිවරයා වූ ඉංජි.ජී.ඩී.ඒ පියතිලක මහත්වරුන්ගේ මෙන් ම අධ්‍යක්ෂ මණ්ඩලයේ දායකත්වය මා අගය කරමි. ඔවුන්ගේ විශිෂ්ට නායකත්වය සහ මගපෙන්වීම ඉතා අගනේය.

ශ්‍රී ලංකාවේ ඉංජිනේරු කෂේත්‍රයේ ගෞරවනීය සහ කීර්තිමත් ස්ථානය ඉදිරියට ගෙන යාමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත තම කැපවීම සහ වටිනා දායකත්වය ලබා දීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහ සියලූ ම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ස්තූතිවන්ත වෙමි.

රටේ පවතින නො විසඳුණු තත්ත්වයන් තුළ පවා අපගේ ඉලක්ක සපුරා ගැනීමට අපට හැකි වූ අතර ඉදිරි වසරවලදී අපගේ අනාගත ඉලක්ක සපුරා ගැනීමට අපි ධනාත්මක ලෙසින් බලා සිටින්නෙමු

ඉංජි.ජී.ආර්.ඒ.එස්.ගුණතිලක
සාමාන්‍යාධිකාරී
B.Sc.Eng.(Hons),M.Sc.(Hydropower)Norway,
M.Sc.(Struct.)Srilanka, MIE(SL), C.Eng., MSSE(SL)

## මූල්‍යමය විශේෂතා

| | සමූහය | | CECB | |
|---|---|---|---|---|
| | 2019 රු. මි | 2018 රු. මි | 2019 රු. මි | 2018 රු. මි |
| ඉදිකිරීම් ආදායම | 10,746 | 11,655 | 5,128 | 7,033 |
| උපදේශන ආදායම | 2,404 | 2,618 | 2,420 | 2,634 |
| ඒකාබද්ධ ආදායම | 13,151 | 14,273 | 7548 | 9,667 |
| දළ ලාභය | 1,386 | 1,864 | 577 | 1,047 |
| බදු පෙර ශුද්ධ ලාභය | 547 | 699 | 340 | 526 |
| බදු පසු ශුද්ධ ලාභය | 345 | 526 | 204 | 404 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | 652 | 632 | 511 | 511 |
| මුළු වත්කම් | 22,994 | 22,308 | 19,637 | 19,373 |
| දායක ප්‍රාග්ධනය | 0.50 | 0.50 | 0.50 | 0.50 |
| මුළු සමකොටස් | 6,842 | 6,210 | 6,247 | 5,799 |
| මුළු සමකොටස් සමතුලිතතාවය | 22,994 | 22,308 | 19,637 | 19,373 |
| ජංගම වත්කම් | 19,612 | 19,349 | 16,718 | 16,814 |
| ජංගම බැරකම් | 15,770 | 15,915 | 13,063 | 13,406 |

## මූල්‍යමය විශේෂතා - සමූහය



# මූල්‍යමය විශේෂතා


ආදායම (රු. මි.)
13,402
11,424
11,675
15,210
14,273
13,151
2014
2015
2016
2017
2018
2019


ශුද්ධ ලාභය (රු. මි.)
412
412
524
522
526
345
2014
2015
2016
2017
2018
2019


අමතර ආදායම් (රු. මි.)
147
169
219
134
195
203
2014
2015
2016
2017
2018
2019


ශුද්ධ මූල්‍ය ආදායම (රු. මි.)
127
153
260
420
397
462
2014
2015
2016
2017
2018
2019


වත්මන් වත්කම් සහ වත්මන් වගකීම් (රු. මි)
12,618
11,232
13,676
11,653
17,001
14,265
20,398
17,097
19,349
15,915
19,612
15,770
2014
2015
2016
2017
2018
2019
මුළු ජංගම වත්කම්
මුළු ජංගම වගකීම්


මුළු කොටස් (රු. මි)
4,530
4,956
5,501
6,016
6,210
6,842
2014
2015
2016
2017
2018
2019


ලාභදායිතා අනුපාත
14.28
15.26
15.60
12.47
13.06
10.54
3.08
3.61
4.49
3.43
3.68
2.63
2014
2015
2016
2017
2018
2019
දළ ලාභ අනුපාතය
ශුද්ධ ලාභ අනුපාතය

# අධ්‍යක්ෂ මණ්ඩලය



2015 දී මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී. CECB හි ඉදිකිරීම් ඉංජිනේරු අංශය වන මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමෙහි සභාපතිවරයා ලෙස ද සමගාමී ව ක්‍රියා කරනු ලබයි. 2010 වර්ෂයේ සිට ඒකාබද්ධ අතිරේක සාමාන්‍යාධිකාරී (EPC) ලෙස එහි කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජු සහාය ලබා දෙන ලදී .ඉංජිනේරු සහ කළමනාකරණය පිළිබඳ වසර 34 කට වැඩි පළපුරුද්දක් සහිත ඒ මහතා ඒ සියල්ල CECB හි විවිධ තනතුරු හොබවමින් අත් පත් කර ගන්නා ලද අතර 1983 දී වික්ටෝරියා ජල විදුලි ව්‍යාපෘතියේ නේවාසික ඉංජිනේරුවරයකු ලෙස ඔහුගේ වෘත්තීය ජීවිතය ආරම්භ කර ව්‍යාපෘති ඉංජිනේරු (1995) ලෙස, ව්‍යාපෘති කණ්ඩායම් නායකයකු (1996), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (2005) සහ 2010 වර්ෂයේ දී අතිරේක සාමාන්‍යාධිකාරී වශයෙන් ගත වූ වර්ෂවල දී ඉහළ යන වගකීම් සහ උසස්වීම් ලබා ගෙන ඇත. ඔහු තම දිගු කාලීන වෘත්තීය ජීවිතය තුළ විවිධ ව්‍යාපෘති කළමනාකරණය කිරීමේ දී ලබා ගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය පිළිබඳ ඔහුගේ විශේෂඥ දැනුම සහ පුළුල් ප්‍රවීණත්වය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ගෙන ගොස් ඇත.

**ඉංජි. පී.ඩී.ඒ. පියතිලක මහතා | සභාපති**
BSc.Eng.Hons, PG. Dip. (Const.Mgt), PG. Dip. (Port & Coastal Eng.) Norway, MIE(SL) CEng., MASCE



2015 වර්ෂයේදී ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස මණ්ඩලයට පත් කරන ලදී. මීට පෙර වර්ෂ 2007 සිට 2010 දක්වා කාලය තුළ CECB හි ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස සේවය කර ඇත. එසේම ඔහු මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කරනු ලබයි.

ආරක්ෂක අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සමගාමීව කටයුතු කරයි. මීට පෙර ජල සම්පත් මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු , පොහොර සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු, සහ රක්නා ලංකා (පෞද්.) සමාගමෙහි ලේකම් යන තනතුරු හොබවා ඇත.

මින් ඉහත දී, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ උතුරු මැද පළාතේ කලාපීය උප සභාපතිවරයා ලෙස කටයුතු කර ඇත.

**එම්.ආර්.පී. රණතුංග මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ**
LL.B (Sri Lanka), Attorney-at-Law, Notary Public, Company Secretary, Actg. Magistrate.



2015 වර්ෂයේ දී අධ්‍යක්ෂවරයෙකු ලෙස මණ්ඩලයට පත් කරන ලදී. 2015 වර්ෂයේ සිට මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් ජාතික වැදගත්කමකින් යුත් සංවර්ධන වගකීම් දරනු ලබයි. වර්ෂ 2005 වර්ෂයේ සිට 2014 දක්වා CECB හි සභාපතිවරයා ලෙස සේවය කරන ලදී.

1981 දී සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස CECB සමඟ සම්බන්ධ වී සිවිල් ඉංජිනේරු, නේවාසික ඉංජිනේරු, ප්‍රධාන නේවාසික ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරු, අතිරේක සාමාන්‍යාධිකාරී සහ සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරමින් වසර 34 කට අධික පෘථුල වූ ඉංජිනේරුමය සහ කළමනාකරණ පළපුරුද්දක් කාර්යාංශය තුළින් ලබා ගෙන ඇත.

ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) අංශය පිහිටුවීමෙහි ලා ව්‍යාපෘති කළමනාකරු (යටිතල ව්‍යුහ ඉදිකිරීම්) සහ අතිරේක සාමාන්‍යාධිකාරී (EPC) ලෙසින් පුරෝගාමී මෙහෙවරක නිරත විය.

**ඉංජි. එන්. රූපසිංහ මහතා | අධ්‍යක්ෂක**
BSc. Eng.(Hons),PG Dip. (Hydropower)Norway, C.Eng.,MIE (SL), MICE (London), Licd. Surveyor



2015 වර්ෂයේ දී අධ්‍යක්ෂවරයෙකු ලෙස මණ්ඩලයට පත් කරන ලදී. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරනු ලබයි. මීට පෙර 2000 සිට 2004 වර්ෂය දක්වා CECB හි සභාපතිවරයා ලෙස කටයුතු කර ඇත. දේශීය ව ජාතික මට්ටමින් හා විදේශීය වශයෙන් ඉංජිනේරු සහ කළමනාකරණය පිළිබඳ පෘථුල අත්දැකීම් ලබා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සැලසුම් ඉංජිනේරු (1965 සිට 1967 දක්වා), නේවාසික ඉංජිනේරු (1967-1968) සහ නේවාසික ඉදිකිරීම් කළමනාකරු (1970 සිට 1972) ලෙස සේවය කර ඇත. ප්‍රධාන ව්‍යාපෘති ඉංජිනේරුවරයෙකු ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට සම්බන්ධ වී (1977), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (1978 - 1985), අතිරේක සාමාන්‍යාධිකාරී ජල සම්පත් සැලසුම් (1986 - 1995) ලෙස උසස්වීම් ලබා CECB හි සාමාන්‍යාධිකාරී ලෙස (1995 සිට 1996 දක්වා) කටයුතු කරන ලදී. එක්සත් රාජධානියේ වන විද්‍යා කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ (1968 සිට 1970 දක්වා) සේවය කරන ලද අතර සහ එක්සත් රාජධානියේ කෙන්ට් ප්‍රාන්ත කවුන්සිලයේ නියෝජ්‍ය අංශ ඉංජිනේරුවරයා ලෙස (1972 සිට 1977 දක්වා) විදේශයන් හි සේවය කර ඇත.

**ඉංජි. එච්.බී. ජයසේකර මහතා | අධ්‍යක්ෂ**
BSc.(Eng.), C.Eng., MICE(UK), FIE(SL)



2016 වර්ෂයේ දී අධ්‍යක්ෂවරයෙකු ලෙස මණ්ඩලයට පත් වූ අතර ඊට සමගාමී ව මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමෙහි විධායක අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරනු ලබයි. 2016 වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කර ඇත. 1980 වර්ෂයේ දී සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) හා සම්බන්ධ වී මාදුරු ඔය වාරිමාර්ග සහ ජල විදුලි ව්‍යාපෘතියේ වැඩබිම ඉංජිනේරුවරයා ලෙස ද, කැනියොන් ජල විදුලි ව්‍යාපෘතියේ සැලසුම් ඉංජිනේරුවරයා ලෙස ද, රන්දෙණිගල ජල විදුලි ව්‍යාපෘතියේ සිවිල් ඉංජිනේරුවරයා ලෙස ද සමනළ වැව ජල විදුලි ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයා ලෙසද සේවය කරන ලද අතර කාර්යාංශයේ වසර 36 කට වැඩි ඉංජිනේරු සහ කළමනාකරණ පළපුරුද්දක් සහිත ඉංජිනේරුවරයෙකි. 2001 වර්ෂයේ දී ඔහු ව්‍යාපෘති කළමනාකරු ලෙස ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) දකුණු පළාත් අංශය ආරම්භ කළ අතර 2006 සිට 2007 දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (EPC-SP) ලෙසත් 2007 සිට 2015 දක්වා අතිරේක සාමාන්‍යාධිකාරී (EPC-SP) ලෙසත් 2016 සැප්තැම්බර් දක්වා ආයතනික අතිරේක සාමාන්‍යාධිකාරී (EPC) ලෙසත් කටයුතු කරන ලදී.

**ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා | අධ්‍යක්ෂක**
B.Sc. Eng, C Eng, MICE (UK), MIE (SL)

2018 වර්ෂයේදී අධ්‍යක්ෂවරයෙකු ලෙස මණ්ඩලයට පත් කරන ලදී. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙහි විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරනු ලබයි. මීට සමගාමී ව, දෘශ්‍ය හා ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාල කවුන්සිලයෙහි, ඩීඑෆ්සීසී බැංකුවෙහි, කළමනාකරණ යෙදුම් (පෞද්.) සමාගමෙහි , රයිගම් වයඹ ලුණු සමාගමෙහි , දක්ෂිණ ලුණු සමාගමෙහි , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකරණ අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයෙකු සහ ඩීඑෆ්සීසී බැංකුවෙහි විගණන කමිටු සාමාජිකයෙකු මෙන් ම වයඹ ලුණු සමාගමෙහි සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි. කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි (IDB) අධ්‍යක්ෂවරයෙකු ලෙස ද, කැලණිය විශ්ව විද්‍යාලයේ ගිණුම්කරණ සහ මූල්‍ය පීඨයේ සාමාජිකයෙකු, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙහි කවුන්සිලයේ සාමාජිකයෙකු මෙන් ම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි PGIM කවුන්සිල සාමාජිකයෙකු වශයෙන් ද ඔහුගේ පූර්ව දායකත්වයන් සපයා ඇත. අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිණුම්කරණය පිළිබඳ කථිකාචාර්යවරයෙකු ලෙස ද , මහ බැංකු පුහුණු වැඩසටහන් සඳහා මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ කථිකාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කර ඇති අතර, පිට පළාත් සිසුන් සඳහා ගිණුම්කරණ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම ආදී අධ්‍යාපන සේවාවන්හි ද යෙදී ඇත. ග්‍රන්ථ පහක් ප්‍රකාශයට පත් කර ඇති අතර මූල්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, විගණනය සහ ඉගැන්වීමේ අත්දැකීම් සහිත ඒ මහතා දැනට වරලත් ගණකාධිකාරීවරුන් සේවය සලසන්නා වූ අමරසේකර සහ සමාගමෙහි ජ්‍යෙෂ්ඨ හවුල්කරුවෙකු ලෙස ක්‍රියා කරනු ලබයි.



**ටී ධර්මරාජා මහතා | අධ්‍යක්ෂක**
FCA (SL), Chartered Accountant, BSc Management Sp. (USJP), FMAAT (SL), APFDA (SL), DA



2015 වර්ෂයේදී අධ්‍යක්ෂවරයෙකු ලෙස මණ්ඩලයට පත් කරන ලදී. 2015 වර්ෂයේ සිට මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ලෙස ජාතික වශයෙන් වැදගත් සංවර්ධන වගකීම් දරනු ලබයි . වර්ෂ 2005 සිට 2014 දක්වා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙහි (CECB) සභාපතිවරයා ලෙස සේවය කර ඇත.

1981 දී සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස CECB සමඟ සම්බන්ධ වී සිවිල් ඉංජිනේරු, නේවාසික ඉංජිනේරු, ප්‍රධාන නේවාසික ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරු, අතිරේක සාමාන්‍යාධිකාරී සහ සාමාන්‍යාධිකාරී යනාදී තනතුරු දරමින් කටයුතු කර ඇති අතර කාර්යාංශයේ වසර 34 කට අධික ඉංජිනේරු සහ කළමනාකරණ පළපුරුද්දක් ලබා ඇත. ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) අංශය පිහිටුවීමෙහි ලා ව්‍යාපෘති කළමනාකරු (යටිතල ව්‍යුහ ඉදිකිරීම්) සහ අතිරේක සාමාන්‍යාධිකාරී (EPC) ලෙසින් පුරෝගාමී මෙහෙවරක නිරත විය.

**ඩී විජේසිරිවර්ධන මහතා | අධ්‍යක්ෂ**
B.Sc. Biological Sciences Hons (UoC), Master of Sociology (UoK), PGD Development Studies (UoC),
PGD Business Studies (UoC), Public Administration Studies (SLIDA)

2019 අගෝස්තු මාසයේ සිට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශ කමිටුවට භාණ්ඩාගාරය නියෝජනය කරමින් අධ්‍යක්ෂවරියක ලෙසත් විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති ලෙසත් පත් කර ඇත. 2010 සිට මේ දක්වා මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක ලෙස සමගාමීව කටයුතු කරනු ලබයි.

සහකාර අධ්‍යක්ෂ - පළාත් සැලසුම් ඒකකය, සබරගමුව පළාත් සභාව, රත්නපුර (1994-1998), සහකාර අධ්‍යක්ෂ - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (1998-2009), නියෝජ්‍ය අධ්‍යක්ෂ - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (2009-2010) ලෙස පූර්ව දායකත්වයන් දැක්වේ. මින් පෙර සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස (2015-2016) සේවය කර ඇති අතර ඇය ශ්‍රී ලංකා සැලසුම් සේවා සංගමයේ සාමාජිකාවකි.



**එස්. විතාණගේ මහත්මිය | අධ්‍යක්ෂ**
B.Sc. Management (USJP), PG.Dip. Sub National Level Development Planning (UoC), MBA(USQ)

# කළමනාකරණ කණ්ඩායම

**ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක**
සභාපති

**ඉංජි.ටී.ඩී වික්‍රමරත්න**
සාමාන්‍යාධිකාරී

**ඉංජි. ඒ ගල්කැටිය**
ඒකාබද්ධ අතිරේක සාමාන්‍යාධිකාරී (EPC)
අතිරේක සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති2)/(අන්තර් ජාතික)

**ඉංජි. පී.ආර්.ඒ.එස්. ගුණතිලක**
ඒකාබද්ධ අතිරේක සාමාන්‍යාධිකාරී (උපදේශන)
අතිරේක සාමාන්‍යාධිකාරී(උපදේශන නැගෙනහිර)

---

**ඉංජි. එච්.එම්. නන්දසේන**
සහකාර සාමාන්‍යාධිකාරී (EPC-මධ්‍යම පළාත)

**ඉංජි. එච්.එම්.එස්. රූපසිංහ (මිය)**
අතිරේක සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත)

**ඉංජි. ටී.ජී.ඩී.ටී. ධර්මවර්ධන**
අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)

**ඉංජි. පී.ඒ.ඩී.එල්.ජේ. සෙනෙවිරත්න**
අතිරේක සාමාන්‍යාධිකාරී (විද්‍යුත් හා යාන්ත්‍රික)

**ඉංජි. එස්. ඩබ්ලිව්. ජයවර්ධන**
අතිරේක සාමාන්‍යාධිකාරී (Design-1)

**ඉංජි.  ඒ.ඒ.පී. අධිකාරි (මිය)**
අතිරේක සාමාන්‍යාධිකාරී (Design -2) /අතිරේක සාමාන්‍යාධිකාරී (DHQC)

**ඩබ්ලිව්.කේ. ලලිත් හේවගේ**
අතිරේක සාමාන්‍යාධිකාරී (ගෘහ නිර්මාණාත්මක)

**ඉංජි. එම්.එන්. ගුණසේන**
අතිරේක සාමාන්‍යාධිකාරී (EPC- ඌව පළාත)

**ඉංජි. ඩබ්ලිව්.ඒ.ඩී.ඩී. නන්දකුමාර**
අතිරේක සාමාන්‍යාධිකාරී (උතුරු මාර්ග)

**ඉංජි. අයි.ආර්.පී. ගුණතිලක**
අතිරේක සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති-1)

**ඉංජි. ඩබ්ලිව්.ඊ.පී. රන්ජන් කුමාර**
අතිරේක සාමාන්‍යාධිකාරී (EPC- සබරගමුව)

**ඉංජි. එස්.ඒ.යූ.ඩී.සී. සිරිවර්ධන**
අතිරේක සාමාන්‍යාධිකාරී (ජල සම්පත් සැලසුම්)

**ඉංජි. ඒ පුෂ්පරාජා**
අතිරේක සාමාන්‍යාධිකාරී (EPC- උතුර)

**ඉංජි. එස්.එස්.ඒ. කළුගල්දෙණිය**
අතිරේක සාමාන්‍යාධිකාරී (Design-3)

**ඉංජි. ජේ.ඒ.ඩී.ආර්.එස්. කුමාර**
අතිරේක සාමාන්‍යාධිකාරී (EPC- උතුරු මැද)

**ඉංජි. එල්.ඩබ්ලිව්.ජේ.එන්. ද අල්විස්**
අතිරේක සාමාන්‍යාධිකාරී (EPC දකුණු පළාත)

**ඉංජි. පී.එම්.පී.සී. ගුණතිලක**
අතිරේක සාමාන්‍යාධිකාරී (EPC- නැගෙනහිර)

**ඉංජි. එස්.බී.ඒ.ඩී. සේමසිංහ**
අතිරේක සාමාන්‍යාධිකාරී (EPC- පොළොන්නරුව)

**ඩබ්ලිව්.ටී.ඩී.පී. පත්මේන්ද්‍ර මයා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (C & QS)

---

**ඩී. මාබෝපිටිය මයා**
මූල්‍ය කළමනාකාර

**ඊ.ආර්.එස්. අමරසේකර මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක

**එස්.එච්.එච්.සී.යූ. සේනානායක මිය**
ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී

**ඒ.සී. ජයතිලක මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (IT)

**එල්.පී.ජයසුන්දර මයා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන)

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2019

### නීතිමය තත්ත්වය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා බහුවිධ උපදේශන සේවාවන් සැපයීම සඳහා 1973 අප්‍රේල් 10 වන දින පිහිටුවන ලදී. එය වර්ෂ 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

මහජන සම්පත්වල භාරකරු වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය එයට පවරා ඇති අයිතීන් හා වගකීම් ඒකාබද්ධ ව හා විශ්වාසනීය ව ඉටු කළ යුතු ය. නිසි සැලසුමකින් තොර ව ගනු ලබන ඕනෑම තීරණයක සහ ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේ දී මහජනතාව විසින් විශාල වශයෙන් වන්දි ගෙවිය යුතු වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය සෑම විටම සිය භාරධූර වගකීම් පිළිබඳ ව විමසිලිමත් විය යුතු ය.

### යහ භාවිතයන්

ව්‍යාපාරයේ යහපත වෙනුවෙන් උපායශීලී තීරණ විවෘත ව හා නිර්මාණාත්මක ව විවාද කරනු ලබන සුපරීක්ෂාකාරී සහ හොඳින් ක්‍රියාත්මක වන අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ඒකාබද්ධ පාලනයෙහි යහ භාවිතයන් විසින් මඟ පෙන්වනු ලබයි. මෙහිදී, සාමාජිකයන්ගේ විරුද්ධ අදහස්වලට ද සවන් දිය යුතු ය. එක් විසංතිකයෙකුට මණ්ඩලයක් මත විශාල වෙනසක් සිදු කළ හැකි ය. "ඉහළ ම කාර්ය සාධනයක් සහිත සමාගම් විසම්මුතිය වගකීමක් ලෙස සලකන්නා වූ ද කිසිදු කරුණක් සාකච්ඡා කළ නො හැකි යැයි නො සලකන්නා වූ ද අතිශයින් විවාදාත්මක අධ්‍යක්ෂ මණ්ඩලයන්ගෙන් සමන්විත වේ".

### නායකත්ව භූමිකාව

අ) ව්‍යවසායයේ මෙහෙවර සහ එහි කොටස් හිමියන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සේවය කළ හැකි හොඳම ආකාරය තීරණය කිරීම.

ආ) නීතිමය අවශ්‍යතා සපුරා ඇති බවටත් සංස්ථාගත කිරීමේ පනතේ/ සංදේශයේ සහ සාංගමික ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ව්‍යාපාර මෙහෙයුම් සිදු වන බවටත් සහතික කිරීම.

ඇ) සිය කොටස් හිමියන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ප්‍රශස්ත ප්‍රතිඵල සහ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා කළමනාකරණය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුගත කිරීම.

ඈ) අනාගත වර්ධනය සඳහා දිගු කාලීන අභිමතාර්ථ සහ අරමුණු සකස් කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිමය අරමුණු වරින් වර සමාලෝචනය කර උපාය මාර්ගික උපදෙස් සැපයීම.

ඉ) ව්‍යවසායයේ සුමට ක්‍රියාකාරිත්වය උදෙසා අභිමතාර්ථ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් බාධාවකින් තොර ව කාලානුරූපී පදනමකින් උත්පාදනය කිරීම හෝ ලබා ගැනීම හෝ තහවුරු කිරීම.

ඊ) ප්‍රමාණවත් වාර්තා සහ ගිණුම් පොත් පවත්වා ගෙන යාමෙන් නිසි වගවීම සහතික කිරීම.

උ) බාධා කිරීම්, පසුබෑම් ආදියෙන් ව්‍යාපාරයෙන් සිදු විය හැකි වැළැක්වීම සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම.

යනාදිය නායකත්ව භූමිකාව තුළ, මණ්ඩලයේ රාජකාරිවලට ඇතුළත් විය යුතු ය.

### අධීක්ෂණ භූමිකාව

එහි අධීක්ෂණ කාර්යභාරය සම්බන්ධයෙන් සැලකීමේ දී, ව්‍යවසායයේ සමස්ත කළමනාකරණය සඳහා සහ වගකීම් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් අතර පුළුල් ලෙස බෙදා හදා ගන්නා වූ ඵලදායී පාලන පද්ධති ස්ථාපිත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වග කිව යුතු ය.

මෙම කාර්යය සඳහා මණ්ඩලයේ වගකීම වනුයේ

අ) ආයතනයේ සහ වැඩි මනත් වශයෙන් මහජනතාවගේ යහපත පිණිස සහ ඒවා රාමු ගත කර ඇති අදහසින් ම අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන බවට වග බලා ගැනීම.

ආ) ව්‍යවසාය එහි මෙහෙයුම් කටයුතු නිවැරදිව සිදු කරනු ලබන්නේ ද යන්න පිළිබඳ ව වග බලා ගැනීම සඳහා කළමනාකරණ තොරතුරු වාර්තා සහ කාර්ය සාධනය ඇගයීම මඟින් කළමනාකරණයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.

ඇ) ප්‍රතිඵල අපේක්ෂිත අපේක්ෂාවන් හා නො ගැලපේ නම්, ඉලක්ක සපුරා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රමාදයකින් තොර ව නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීම.

ඈ) දක්ෂ පුද්ගලයින් කළමනාකරුවන් ලෙස පත් කර ස්වාධීන ව සහ වගකීමෙන් යුතුව සිය කාර්යයන් ඉටු කිරීමට හිතකර පරිසරයක් ලබා දීම තුළින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර නිසි බලය පැවරීම සහ කණ්ඩායම් හැඟීමක් ඇති බවට වග බලා ගැනීම.

ඉ) වාර්ෂික මහා සභා රැස්වීම්වල දී කොටස් හිමියන් වෙත වාර්තා කිරීම /පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (COPE) රැස්වීම්වලට සහභාගි වීම.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හත් දෙනෙකුගෙන් (07) මණ්ඩලය සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පහත පරිදි වේ;

| | | |
|---|---|---|
| ඉංජි. පී.ඩී.ඒ. පියතිලක | - | සභාපති |
| එම්.ආර්.පී. රණතුංග | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| ඉංජි. එන්. රූපසිංහ | - | අධ්‍යක්ෂ |
| ඉංජි. එච්.ඩී. ජයසේකර | - | අධ්‍යක්ෂ |
| ඉංජි. එස්.පී.පී. නානායක්කාර | - | අධ්‍යක්ෂ |
| ටී. ධර්මරාජ | - | අධ්‍යක්ෂ |
| ඩී. විජේසිරිවර්ධන | - | අධ්‍යක්ෂ (ජනවාරි 2019 – ජූලි 2019) |
| එස්. විතානගේ | - | අධ්‍යක්ෂ ( අගෝස්තු 2019 – දෙසැම්බර් 2019) |

# රැස්වීම් සහ පැමිණීම

2019 මූල්‍ය වර්ෂය දක්වා මණ්ඩලය අවස්ථා 11කදී රැස්වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ පැමිණීම පහත පරිදි විය.

| නම | තනතුර | 2019<br>15 පෙබ. | 27 පෙබ. | 29 මාර්තු | 02 මැයි | 30 මැයි | 27 ජූනි | 29 ජූලි | 29 අගෝ. | 20 සැප්. | 17 ඔක්. | 11 නොවැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉංජි. පී.ඩී.ඒ. පියතිලක | සභාපති | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| එම්.ආර්.පී. රණතුංග | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | - | |
| ඉංජි. එන්. රූපසිංහ | අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ab | ✓ | ✓ | ✓ |
| ඉංජි. එච්.ඩී. ජයසේකර | අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ab | ab | ✓ |
| ඉංජි. එස්.පී.පී. නානායක්කාර | අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ටී. ධර්මරාජ | අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ඩී. විජේසිරිවර්ධන | අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | - | | |
| එස්. විතානගේ | අධ්‍යක්ෂ | | | | - | | | | ✓ | ✓ | ✓ | ✓ |

# විගණන කමිටු වාර්තාව

### විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 55 ප්‍රකාර ව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කර ඇති විශේෂිත යොමු නියමයන් (TOR) මඟින් විගණන සහ කළමනාකරණ කමිටුව පාලනය වේ. යොමු නියමයන් සහ රජයේ අවශ්‍යතා අනුව එහි වගකීම් ඉටු කිරීමේ අරමුණු කෙරෙහි කමිටුව අවධානය යොමු කර සිටී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට සහ අනෙකුත් අදාළ නීතිමය අවශ්‍යතාවලට අනුකූල ව මූල්‍ය වාර්තාකරණය සිදු වන බව සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීමේ කාර්යයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමේ වගකීම විගණන කමිටුව විසින් දරනු ලැබේ.

තවද, අඛණ්ඩ ව සමාලෝචනය, අධීක්ෂණය, අනුකූල නො වීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ ඉදිරිපත් කිරීම මඟින් රජය විසින් නිකුත් කරනු ලබන අදාළ නීති රීති, චක්‍රලේඛ සියල්ල අනුගමනය කරනු ලබන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය යුතු ය. විගණන කමිටුව විසින් අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි ලේඛන, කෝප් නිර්දේශ සමාලෝචනය කළ යුතු අතර, ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය විය යුතු ය.

ඊට අමතර ව, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලයට සහාය විය යුතු ය. කාරක සභාව අවම වශයෙන් මාස තුනකට වරක් රැස් විය යුතු අතර නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැලසීම සඳහා එහි නිර්දේශයන් එම රැස්වීමේ කාර්ය සටහන් සමඟ හැකි ඉක්මනින් එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතු ය. විගණන කමිටුවේ යොමු නියමයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිර්ණය කිරීම සහ වාර්ෂික විගණන සැලස්ම සමාලෝචනය කිරීම, ආයතනයේ සියලු ම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද සමාලෝචනය කිරීම නිශ්චය කිරීම , පිරිවැය ඵලදායිතාවය සඳහා සහ නාස්තිකාර වියදම් ආදිය බැහැර කිරීම සඳහා ඒකාකාර කාල පරාසයන් තුළ කාර්ය සාධනය සමාලෝචනය කිරීම , බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වීම සහ විගණකාධිපති/ බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපි අනුව කටයුතු කිරීම, ව්‍යවස්ථා, රෙගුලාසි, නීතිරීති සහ චක්‍රලේඛවලට අනුකූල වන්නේ ද යන්න නිශ්චය කිරීම, ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල වන්නේ ද යන්න සහතික කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම, රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ උපදේශන කාරක සභාවේ නිර්දේශ/මග පෙන්වීම් ක්‍රියාවට නැංවීම සමාලෝචනය කිරීම, වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයා ගැනීම් පිළිබඳ වාර්තාවක් සකස් කිරීම, ව්‍යවසාය සතු අනුබද්ධිත ආයතන තිබේ නම් ඒවාට අදාළ ගැටළු නිතිපතා නිරාකරණය කිරීම.

### සංයුතිය

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 55 හි විධිවිධානවලට අනුව, කමිටුවේ සභාපතිත්වය දරන භාණ්ඩාගාර නියෝජිතවරයා ද ඇතුළු ව, කාර්යාංශයේ විගණන කමිටුව විධායක නො වන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් (03) සමන්විත වේ.

විගණන කමිටුවේ වත්මන් සාමාජිකයින් පහත පරිදි වේ.

කමිටුවේ සභාපති
ඩී. විජේසිරිවර්ධන මහතා
(2019 ජනවාරි සිට 2019 ජූලි දක්වා)

එස්. විතානගේ මහත්මිය
(අගෝස්තු 2019 සිට දෙසැම්බර් 2019 දක්වා)

අධ්‍යක්ෂ - ටී. ධර්මරාජා මහතා
අධ්‍යක්ෂ - ඉංජි. එච්.ඩී. ජයසේකර මහතා

මූල්‍ය හා කළමනාකරණ විශේෂඥතාව සමඟ කමිටුවට වාණිජ හා රාජ්‍ය අංශයේ සම්මිශ්‍රණය වූ පළපුරුද්දක් ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් එස්.එච්.එච්.සී.යූ. සේනානායක මිය විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන අතර ප්‍රධාන අභ්‍යන්තර විගණක ඊ.ආර්.එස්. අමරසේකර මයා විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලබයි.

## රැස්වීම් සහ ඒ සඳහා පැමිණීම

2019 මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටුව අවස්ථා හතරක දී රැස් වූ අතර ඔවුන්ගේ පැමිණීම් පහත දැක්වෙන පරිදි වේ.

| නම | 2019 | | | |
|---|---|---|---|---|
| | 12 මාර්තු | 19 මාර්තු | 28 ජූනි | 27 සැප්. |
| ඩී. විජේසිරිවර්ධන<br>කමිටුවේ සභාපති | ✓ | නොපැමිණීම | ✓ | - |
| එස්. විතානගේ<br>කමිටුවේ සභාපති | | - | | ✓ |
| වී. ධර්මරාජා<br>අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | ✓ |
| ඉංජි. එච්.ඩී. ජයසේකර<br>අධ්‍යක්ෂ | ✓ | ✓ | ✓ | නොපැමිණීම |

වෙනත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් මෙන් ම බාහිර විගණන නිළධාරීන්ට සුදුසු අවස්ථාවල දී සාකච්ඡා සඳහා සහභාගි වන ලෙස ආරාධනා කරනු ලැබේ. විගණන කමිටුවේ ක්‍රියාදාමයන් නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

## අනුකූල වීම

අදාළ නීති හා නියාමන අවශ්‍යතාවලට අනුකූල ව ක්‍රියාකාරී වීමට කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහතික වන අතර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල වන බව සහතික කරනු ලැබේ. පවතින පාලන ක්‍රම හා අවදානම් කළමනාකාර ක්‍රියා පටිපාටිවල ප්‍රමාණාත්මකභාවය පිළිබඳ ව කමිටුව ඇගයීමක් සිදු කරන ලද අතර පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය අතිරේක පාලනයන් සහ අවදානම් වැළැක්වීමේ උපායමාර්ගයන් පිළිබඳ ව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

තව ද, කාරක සභාව විසින් කාර්යාංශයේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය සමාලෝචනය කර එහි ව්‍යාපාර කටයුතු සඳහා අනාගත අපේක්ෂාවන් පිළිබඳ ව ඇගයීමක් සිදු කර ඒ අනුව, අදාළ ගිණුම් වාර්තා පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද අඛණ්ඩ පැවත්ම පිළිබඳ උපකල්පනය යෝග්‍ය වන බව සහතික කර ඇත.

## බාහිර විගණනය

කාර්යාංශයෙහි බාහිර විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා කටයුතු කරනු ලබයි.

එස් විතානගේ මහත්මිය
සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව

# ඒකාබද්ධ තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ඒකාබද්ධ තොරතුරු

### 1.1 පිහිටීම සහ නීතිමය තත්ත්වය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වර්ෂ 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනතේ විධිවිධාන යටතේ ස්ථාපිත ශ්‍රී ලංකාවේ පිහිටා ඇති රාජ්‍ය සංස්ථාවකි.

කාර්යාංශයේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටා ඇත.

2019 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන , කාර්යාංශය සහ එහි පරිපාලිත සමාගම්වලින් (එක්ව ගත් කල "සමූහය" ලෙස හැඳින්වෙන ) සමන්විත වේ.

කාර්යාංශයේ සියලු ම සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මූලික වශයෙන් ඉදිකිරීම්, උපදේශන සහ ඕනෑම ඉංජිනේරුමය සම්බන්ධිත ක්‍රියාකාරකම් ව්‍යාපාරයන්හි නිරත ව සිටී.

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම (CESL) යනු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ පූර්ණ අනුබද්ධිත සමාගමක් වන අතර ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත එම ආයතනය විසින් හෝ සමූහ ව්‍යාපාරයක හෝ සමූහයක සාමාජිකයෙකු ලෙස සිවිල්, විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි ඉදිකිරීම්-සැලසුම්, ටර්න්කී සහ වෙනත් ආකාරයේ ඉදිකිරීම් කාර්යයන් මෙන් ම ඒ හා සම්බන්ධ හෝ ඊට අනුබද්ධ හෝ ආනුෂංගික ව්‍යාපාර භාර ගැනීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නිරත ව සිටී.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූල වීමේ ප්‍රකාශනය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සමකොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් ද සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS සහ LKASs) අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

විශේෂයෙන් සඳහන් කර නොමැති නම් පරිපාලිත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වන ලෙස සකස් කර ඇත.

### 2.2 ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මතු දැක්වෙන භෞතික අයිතමයන් සඳහා හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

සාධාරණ වටිනාකමට අගයන් ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් (LKAS -39)

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ සාධාරණ වටිනාකමට අගයනු ලැබේ. (LKAS -16)

ආයුගණක තක්සේරු කිරීම් පදනම් කර ගනිමින් හඳුනා ගත් සේවක ප්‍රතිලාභ බැරකම් (LKAS-19)

ප්‍රත්‍යාසන්න අනාගතයේ දී කාර්යාංශයට අඛණ්ඩ ව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව කාර්යාංශයේ අධ්‍යක්ෂවරුන් විසින් ඇගයීමක් කර ඇති අතර ව්‍යාපාරය ඈවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් එහි දී පෙනී ගොස් නොමැත.

### 2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

කාර්යාංශයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් (LKR) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

### 2.4 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFR) අනුකූල ව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වත්කම් හා බැරකම්, ආදායම් සහ වියදම්වල ප්‍රතිපත්ති සහ වාර්තාගත ප්‍රමාණයන් යොදා ගැනීමට බලපෑම් ඇති කරන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරීත්වයට සිදු වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ ඒ ආශ්‍රිත උපකල්පන පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ අදාළ තත්ත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරන වෙනත් විවිධ සාධක මත වන අතර, එහි ප්‍රතිඵල විසින් අනෙකුත් මූලාශ්‍රවලින් පහසුවෙන් ගම්‍යමාන නොවන වත්කම් සහ බැරකම්වල පවතින වටිනාකම් සම්බන්ධයෙන් තීන්දු ගැනීමේ දී පදනම සකස් කරනු ලැබේ.

ඉදිරියට යෑමේ පදනම මත ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන අගයනු ලැබේ.

සංශෝධනය බලපානු ලබන්නේ එම මූල්‍ය වර්ෂය සඳහා හෝ සංශෝධනයේ කාල පරිච්ඡේදය සඳහා පමණක් නම්

# ඒකාබද්ධ තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදයේදී ද වර්තමාන හා අනාගත යන මූල්‍ය වර්ෂ දෙවර්ගය සඳහා ම සංශෝධනය බලපානු ලබන්නේ නම් අනාගත කාල පරිච්ඡේදයේදී ද ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන හඳුනා ගනු ලැබේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ලැබූ ප්‍රමාණයන් මත වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ තීරණාත්මක තීන්දු පිළිබඳ තොරතුරු මතු දැක්වෙන සටහන්වල ඇතුළත් කර ඇත.

| විවේචනාත්මක ගිණුම්කරණය ඇස්තමේන්තු / විනිශ්චය | සටහන් | පිටු අංක |
|---|---|---|
| කොන්ත්‍රාත් ආදායම, පිරිවැය සහ නිම කරන ලද ප්‍රතිශතය | 09 | 29 |

මූල්‍ය ප්‍රකාශනවල භෞතික ගැලපීමක ප්‍රතිඵලයක් ලෙස වඩාත් සැලකිය යුතු අවදානමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතා පිළිබඳ තොරතුරු මතු දැක්වෙන සටහන්වල ඇතුළත් කර ඇත.

| විවේචනාත්මක ගිණුම්කරණය ඇස්තමේන්තු / විනිශ්චය | සටහන | පිටු අංක |
|---|---|---|
| දේපල, පිරියත හා යන්ත්‍රෝපකරණ | 15 | 31 |
| සේවක ප්‍රතිලාභ | 24 | 35 |
| විලම්භීත බදු බැරකම් | 25 | 36 |

### 3 සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 3.1 ඒකාබද්ධ වීමේ පදනම

#### (අ) ව්‍යාපාර ඒකාබද්ධ වීම

සමූහයේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS10 ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල විධිවිධාන ප්‍රකාර ව, කාර්යාංශයේ සහ එහි අනුබද්ධිත ආයතනවල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ වීමෙන් සමන්විත වේ.

#### (ආ) අනුබද්ධ ආයතන

අනුබද්ධ ආයතන යනු සමූහය මඟින් පාලනය වන ආයතන වේ. පාලනය ආරම්භ කරන ලද දින සිට පාලනය අවසන් වන දින දක්වා අනුබද්ධ ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වේ. සමූහය විසින් යොදා ගන්නා ප්‍රතිපත්ති සමඟ අනුගත වීම සඳහා අනුබද්ධ ආයතනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති අවශ්‍ය විටෙක වෙනස් කරනු ඇත.

#### (ඇ) ඒකාබද්ධ වීම මත ඉවත් කරනු ලබන ගනුදෙනු

අන්තර් සමූහ ශේෂයන් සහ ගනුදෙනු , සහ අන්තර් සමූහ ගනුදෙනු වලින් පැන නගින කිසියම් උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් යනාදිය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ඉවත් කරනු ලැබේ. සමකොටස් ගිණුම්ගත ආයෝජකයින් සමඟ කරන ගණුදෙණුවලින් පැන නගින උපලබ්ධි නො වූ ලාභ ආයෝජනයට එරෙහි ව ආයෝජිතයාට සමූහයෙහි ඇති කැමැත්තේ ප්‍රමාණයට ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නො වූ අලාභ උපලබ්ධි නො වූ ලාභ ඉවත් කරන ආකාරයට සමාන ආකාරයකින් ඉවත් කරනු ලබන නමුත් එසේ සිදු කරනු ලබන්නේ අගය අඩු වීම පිළිබඳ සාක්ෂියක් නො මැති ප්‍රමාණය දක්වා පමණි.

#### 3.2 ජංගම හා ජංගම නොවන වර්ගීකරණය

සමූහය විසින් ජංගම හා ජංගම නො වන වර්ගීකරණය මත පදනම් ව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කරනු ලබයි.

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ සාක්ෂාත් කර ගැනීමට හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරයි නම්
- මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වා ගෙන යනු ලබයි නම්
- වාර්තාකරණ කාලයෙන් පසු මාස දොළහක් ඇතුළත සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරයි නම්
- මුදල් හෝ මුදල් සමාන දෑ හුවමාරු කිරීම සීමා කර නො මැති නම් හෝ වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා බැරකමක් පියවීමට භාවිතා කරයි නම් හෝ

එවැන්නක් ජංගම වත්කමක් වේ. අනෙකුත් සියලු ම වත්කම් ජංගම නො වන ලෙස වර්ගීකරණය කර ඇත. බැරකමක් ජංගම වනුයේ,

- එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ නිරාකරණය කිරීමට බලාපොරොත්තු වේ නම්
- එය මූලික වශයෙන් වෙළඳාමේ අරමුණ සඳහා පවත්වනු ලැබේ නම්
- එය වාර්තා කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත පියවීමට නියමිත නම්

හෝ

# ඒකාබද්ධ තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

- වාර්තාකරණ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා බැරකම් පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැති නම් ය.

කල් දැමූ බදු බැරකම් ඇතුළු අනෙකුත් සියලු ම බැරකම් ජංගම නො වන ලෙස සමූහය විසින් වර්ගීකරණය කරනු ලබයි.

### 3.3 විදේශ මුදල් ගනුදෙනු

ගනුදෙනුව සිදු කරන අවස්ථාවේ පවතින විනිමය අනුපාතය අනුව සියලු ම විදේශ විනිමය ගනුදෙනු ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. වාර්තා කරන දිනට පවතින ස්ථානීය විනිමය අනුපාතිකය අනුව විදේශ මුදල් වලින් නාමකරණය කරන ලද මූල්‍යමය වත්කම් සහ බැරකම් ක්‍රියාකාරී මුදල් වර්ගයට නැවත පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදල් වර්ගයක පවතින ඓතිහාසික පිරිවැයට අගය කරනු ලබන මූල්‍යමය නොවන අයිතම මුල් ගනුදෙනු දිනට පවතින විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ. වටිනාකම් නිශ්චය කරනු ලබන අවස්ථාවේ දී පැවති විනිමය අනුපාත භාවිතා කරමින් මුදල්මය නොවන වත්කම් සහ බැරකම් පරිවර්තනය කරනු ලැබේ.

පරිවර්තන වෙනස ඇති කරලීම සඳහා හේතු වූ අයිතමයේ ලාභයට හෝ අලාභයට සමගාමීව මුදල්මය නො වන අයිතම පරිවර්තනය කිරීමෙන් පැන නඟින ලාභය හෝ අලාභය හඳුනා ගනු ලැබේ.

විදේශ විනිමය ගනුදෙනු පරිවර්තනය කිරීම මත පැන නගින විදේශ විනිමය වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ලාභයක් හෝ අලාභයක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 3.4 මූල්‍ය නොවන වත්කම්වල අගය අඩු වීම

වත්කම්වල පවතින අගය අඩුවීමක් පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේ ද යන්න නිශ්චය කිරීම සඳහා සමූහය විසින් එක් එක් වාර්තාකරණ දිනට තක්සේරු කරනු ලැබේ. එවැනි යම් ඇඟවීමක් තිබේ නම්, කාර්යාංශය විසින් වත්කමෙහි ආපසු අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ.

වත්කමක හෝ මුදල් උත්පාදනය කරනු ලබන ඒකකයක අය කර ගත හැකි වටිනාකම භාවිතයේ ඇති වටිනාකම සහ එහි සාධාරණ අගය අඩු කල විකිණීම සඳහා වන පිරිවැය යන මෙයින් වැඩි අගය වේ. වත්කමක හෝ මුදල් උත්පාදනය කරනු ලබන ඒකකයක පවතින අගය එහි එහි ආපසු ලබාගත හැකි ප්‍රමාණය ඉක්මවන විට, වත්කමෙහි අගය අඩු වී ඇති බවට සලකනු ලැබේ.

භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේ දී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ කාලය, මුදල්වල වටිනාකමෙහි වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම්, වත්කමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතා කරමිනි. විකිණීම සඳහා අඩු වියදම් සාධාරණ වටිනාකමක් තීරණය කිරීමේදී , තිබේ නම්, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනු හඳුනා ගත නො හැකි නම්, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිතා කරනු ලැබේ. මෙම ගණනය කිරීම් ඇගයීමේ ගුණාකාර, ප්‍රසිද්ධියේ වෙළඳාම් කරන අනුබද්ධ සමාගම් සඳහා උද්ධෘත කොටස් මිල හෝ පවතින වෙනත් සාධාරණ වටිනාකම් දර්ශක මගින් සනාථ කරනු ලැබේ.

කලින් නැවත තක්සේරු කරන ලද දේපලක් එම නැවත තක්සේරුවේ දී වෙනත් විස්තීරණ ආදායමක් වෙත ගෙන යන ලද අවස්ථාවක හැර, අගය අඩු වූ වත්කම් වල ක්‍රියාකාරිත්වයට අනුරූප වන එම වියදම් කාණ්ඩවල ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ අගය අඩුවීමේ අලාභ හඳුනා ගැනේ. මෙම අවස්ථාවෙහිදී, කිසියම් පෙර නැවත ඇගයීමක ප්‍රමාණය දක්වා වෙනත් විස්තීරණ ආදායමක ද අගය අඩු වීම හඳුනා ගැනේ.

කීර්තිනාමයට අදාළ වත්කම්හි අගය අඩු වීම් හැර, අනෙකුත් වත්කම් හි කලින් හඳුනා ගත් අගය අඩු වීම් හෝ අලාභ තවදුරටත් නො පවතියි හෝ අඩු වී ඇති බවට කිසියම් ඇඟවීමක් තිබේ ද යන්න පිළිබඳ ව සෑම වාර්තාකරණ දිනයකදී ම තක්සේරුවක් කරනු ලැබේ. එවැනි ඇඟවීමක් තිබේ නම්, කාර්යාංශය විසින් වත්කම් හෝ මුදල් උත්පාදනය කරනු ලබන ඒකකයේ ආපසු ලබාගත හැකි මුදල ඇස්තමේන්තු කරයි.

කලින් හඳුනා ගත් අගය අඩු වීමේ අලාභයක් ප්‍රතිවර්තිත කරනු ලබන්නේ අවසන් අගය අඩු වීමේ අලාභය හඳුනා ගැනීමෙන් පසුව වත්කම්වල අය කර ගත හැකි මුදල තීරණය කිරීමට භාවිතා කරන උපකල්පනවල වෙනසක් සිදුවී ඇත්නම් පමණි. වත්කම් සඳහා පෙර වසරවල දී අගය අඩු වීමේ අලාභ කිසිවක් හඳුනා ගෙන නො මැති නම් වත්කමෙහි පවතින වටිනාකම ,ක්ෂය වීමෙන් හෝ ක්‍රමක්ෂයෙන් ශුද්ධ ලෙස නිශ්චය කරනු ලැබිය හැකි පවතින වටිනාකම ඉක්මවා නො යන ප්‍රමාණයට පමණක් අගය අඩු වීමේ අලාභයක් ප්‍රතිවර්තිත වේ.

### 3.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 7 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන, අනුව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත.

### මුදල් සහ මුදල් සමාන දෑ

අතේ ඇති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි වූ ද ලැබෙන පොලී වටිනාකම වෙනස් වීමේ ඉතා අවම අවදානමක් සහිත වූ ද කෙටි කාලීන ආයෝජන සහ ලැබෙන ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කෙරෙන අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඉදිරිපත් කිරීමේ අරමුණින්, ගෙවන ලද ලාභාංශ මූල්‍ය මුදල් ප්‍රවාහය ලෙසත් ගෙවන ලද පොලී මෙහෙයුම් මුදල් ප්‍රවාහයන් යටතේත් වර්ගීකරණය කරනු ඇත.

ඉල්ලූම් කිරීමේ දී නැවත ගෙවිය යුතු හා සමූහයේ මුදල් කළමනාකරණයේ අවශ්‍ය කොටසක් තනන බැංකු අයිරා මුදල් සහ මුදල් සමාන දෑ වල සංඝටකයක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

### 3.6. වාර්තා කරන දිනට බලාත්මක නොවන නමුත් නිකුත් කර ඇති නව ගිණුම්කරණ ප්‍රමිත

සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන ලද දිනට බලාත්මක නො වන නමුත් නිකුත් කර ඇති ප්‍රමිතීන් සහ අර්ථ දැක්වීම් පහත විස්තර කර ඇත. යොදා ගත යුතු නම් , ඒවා බලාත්මක වූ විට මෙම ප්‍රමිතයන් අදාළ කර ගැනීමට සමූහය අදහස් කරයි.

### SLFRS 16 ) කල්බදු

SLFRS 16 මගින් කල්බදු හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා මූලධර්ම දක්වා ඇති අතර LKAS 17 යටතේ මූල්‍ය කල්බදු සඳහා ගිණුම්කරණයට සමාන තනි ශේෂ පත්‍ර ආකෘතියක් යටතේ සියලූ ම කල්බදු සඳහා බදුකරු විසින් ගිණුම්ගත කිරීම අවශ්‍ය වේ. මෙම ප්‍රමිතයට බදු දෙන්නන් සඳහා හඳුනා ගැනීමේ නිදහස් කිරීම් දෙකක් ඇතුළත් වේ . අඩු වටිනාකම් වත්කම් හා කෙටි කාලීන බදු දීම . කල්බදු ආරම්භක දිනයේ දී, බදුකරු විසින් කල්බදු ගෙවීම සම්බන්ධ වගකීම (එනම්, කල්බදු වගකීම) සහ කල්බදු කාල සීමාව තුළ යටත් වත්කම භාවිතා කිරීමේ අයිතිය ලබා දීමේ වත්කමක් (එනම්, භාවිතයේ අයිතිය සම්බන්ධ වත්කම) හඳුනා ගනී.

කල්බදු වගකීම සම්බන්ධ පොලී වියදම සහ වත්කම භාවිත කිරීමේ අයිතිය සම්බන්ධ වත්කමේ ක්ෂයවීම් වියදම බදු දෙන්නන් විසින් වෙන වෙනම හඳුනා ගැනීමට අවශ්‍ය වනු ඇත. යම් යම් සිද්ධීන් (උදා., කල්බදු කාලසීමාවෙහි වෙනසක්, එම ගෙවීම් තීරණය කිරීමට භාවිතා කරන දර්ශකයක හෝ අනුපාතිකයේ වෙනසක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක්) සිදු වූ විට බදු දෙන්නන් විසින් කල්බදු වගකීම නැවත මැනීමට ද අවශ්‍ය වනු ඇත. බදුකරු සාමාන්‍යයෙන් කල්බදු වගකීම නැවත මැනීමේ ප්‍රමාණය වත්කම භාවිතා කිරීමේ අයිතියට ගැළපීමක් ලෙස හඳුනා ගනී.

2019 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා SLFRS 16 බලාත්මක වේ. කලින් අයදුම් කිරීමට අවසර ඇත. නමුත් ආයතනයක් SLFRS 15 අයදුම් කිරීමට පෙර සිදු කල නො හැක. සම්පූර්ණ ප්‍රත්‍යාලෝකනයක් හෝ නවීකරණය කරන ලද ප්‍රත්‍යාලෝකන ප්‍රවේශයක් භාවිතා කරමින් ප්‍රමිතය යෙදීමට බදුකරුට තෝරා ගැනීමක් කළ හැක. ප්‍රමිතයේ සංක්‍රාන්ති විධිවිධාන මඟින් යම් සහන සඳහා අවසර ලබා දෙයි.

මෙම නව ප්‍රමිතීන් සහ අර්ථකථන කිසිවක් සමූහයේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි භෞතිකමය බලපෑමක් ඇති නො කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එවැනි ප්‍රමිත සහ අර්ථ නිරූපණයන් පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් බලාපොරොත්තුවෙන්, එහි බලපෑමේ ප්‍රමාණය සම්බන්ධ ව කළමනාකාරීත්වය විසින් තීරණය කර නො මැත.

### 3.7 මූල්‍ය මෙවලම්

#### 3.7.1 මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම්

#### (අ) මූලික හඳුනා ගැනීම සහ මැනීම

සමූහය මෙවලමෙහි කොන්ත්‍රාත්තුගත ප්‍රතිපාදන සඳහා පාර්ශ්වයක් බවට පත් වන විට දී යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය බැරකමක් එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා ගනු ලබයි.

කාර්යාංශය ප්‍රථමයෙන් ම එහි මූල්‍ය වත්කම් අගයනු ලබන්නේ සාධාරණ වටිනාකමකටය. ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් නොමැති මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුව ම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය සියල්ල මූල්‍ය වත්කම් නම් පිරිවැයට එකතු කරනු ලබයි.

කාර්යාංශය ප්‍රථමයෙන් ම එහි මූල්‍ය බැරකම් සාධාරණ වටිනාකමකින් අගයනු ලබයි. ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් නොමැති මූල්‍ය බැරකම් වේ නම්, මූල්‍ය බැරකම් නිකුතුවට සෘජුව ම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය සියල්ල පවතින වටිනාකමෙන් අඩු කරනු ලබයි.

#### (ආ) මූල්‍ය වත්කම් වර්ගීකරණය

(i) මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමාගමේ ව්‍යාපාර ආකෘතිය

සහ

- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මත පදනම් ව මූල්‍ය වත්කම් පසු ව ක්‍රමක්ෂිත පිරිවැයෙන් ගණනය කරනු ලබන මූල්‍ය වත්කම්, වෙනත් විස්තීරණ ආදායමක් (OCI) හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම්, හෝ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

(ii) ක්‍රමක්ෂිත පිරිවැයෙන් ගණනය කරනු ලබන මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි ද්විත්වය ම සපුරා ඇත්නම් මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂිත කළ පිරිවැයකින් මනිනු ලැබේ.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීම අරමුණු කරගත් ව්‍යාපාර ආකෘතියක් තුළ මූල්‍ය වත්කම් තබා තිබීම.

- මුල් හිඟ මුදලේ මූලික මුදල හා පොලිය පමණක් ගෙවීම සඳහා මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් මගින් නිශ්චිත දිනවලදී මුදල් ප්‍රවාහයන් ඉහල නැංවීම

(iii) වෙනත් විස්තීරණ ආදායමක් (OCI) හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි දෙක ම සපුරා ඇත්නම් වෙනත් විස්තීරණ ආදායමක් හරහා මූල්‍ය වත්කමක් සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකෙන්ම අරමුණු සාක්ෂාත් කරගනු ලබන ව්‍යාපාරික ආකෘතියක් තුළ මූල්‍ය වත්කම් තබා තිබීම.

- මුල් හිඟ මුදලේ මූලික මුදල හා පොලිය පමණක් ගෙවීම සඳහා මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් මගින් නිශ්චිත දිනවලදී මුදල් ප්‍රවාහයන් ඉහල නැංවීම.

(iv) ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම්

ඉහත (ii) සහ (iii) ඡේදය අනුව ක්‍රමක්ෂිත පිරිවැයකින් හෝ අධ්‍යක්ෂ හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන්නේ නම් මිස මූල්‍ය වත්කමක් ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ.

### (ඇ) මූල්‍ය වගකීම් වර්ගීකරණය

- ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම්.

- වෙළඳපොළට වඩා අඩු පොලී අනුපාතයකට ණයක් ලබා දීමට කැපවීම් අවස්ථාවලදී හැර, මූල්‍ය වගකීම් පසුව ක්‍රමක්ෂය කළ වියදමින් මනිනු ලැබේ.

### (ඈ) නැවත වර්ගීකරණය

(i) මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලබන්නේ සමාගම මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සිය ව්‍යාපාර ආකෘතිය වෙනස් කරන අවස්ථාවක පමණි.

සමාගම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන්නේ නම්, එවැනි ප්‍රතිවර්ගීකරණයක් නැවත වර්ගීකරණය කළ දින සිට අපේක්ෂිත පරිදි යෙදේ. කලින් හඳුනා ගත් ලාභ , අලාභ (අගය අඩු වීමේ ලාභ හෝ අලාභ ඇතුළු ව) නැවත ප්‍රකාශ නො කෙරේ.

(ii) මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නො කෙරේ.

### (ඉ) ක්‍රමක්ෂිත පිරිවැය ගණනය

එලදායී පොලී ක්‍රමය භාවිතා කිරීමෙන් පොලී ආදායම ගණනය කරනු ලබන්නේ මූල්‍ය වත්කම්වල පවතින දළ වටිනාකමට එලදායී පොලී අනුපාතයක් යෙදීමෙනි.

### (ඊ) අගය අඩු වීම

මූල්‍ය වත්කමක් මත අපේක්ෂිත ණය අලාභ සඳහා සමාගම අලාභ දීමනා හඳුනා ගනී.

වාර්තා කරන දිනයේදී මූල්‍ය හඳුනාගැනීම්වලින් පසු මූල්‍ය මෙවලම්හි ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අවස්ථාවක, ජීවිත කාලය තුළ අපේක්ෂිත ණය පාඩුවලට සමාන මුදලක් අලාභ දීමනා ලබා දෙනු ලැබේ.

වාර්තා කරන දිනයේදී මූල්‍ය හඳුනාගැනීම් වලින් පසු මූල්‍ය උපකරණයේ ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී නොමැති විට, එම මූල්‍ය උපකරණය සඳහා අලාභ දීමනා මාස 12ක අපේක්ෂිත ණය පාඩු වලට සමාන ලෙස ගණනය කරනු ලැබේ.

### (උ) මූල්‍ය වත්කම් හඳුනා නොගැනීම

පහත අවස්ථාවන්හි දී සමාගම මූල්‍ය වත්කම් හඳුනා නො ගනී.

- මූල්‍ය වත්කම් වලින් මුදල් ප්‍රවාහයට ඇති ගිවිසුම් අයිතිය කල් ඉකුත් වීම.

- මූල්‍ය වත්කම් මාරු කරන අතර මාරු කිරීම නිසා හඳුනා නො ගැනීම

### (ඌ) මූල්‍ය බැරකම් හඳුනා නොගැනීම

මූල්‍ය බැරකමක් (හෝ මූල්‍ය බැරකමක කොටසක්) එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් ඉවත් කරනු ලබන්නේ එය අවසන් වූ විට පමණි. එනම් ගිවිසුමෙහි දක්වා ඇති බැඳීම ඉවත් වූ විට හෝ අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට ය.

## 3.8 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

### 3.8.1 හඳුනා ගැනීම සහ මැනීම

වත්කම් හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් ඇතැයි සළකන්නේ නම්, වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ හඳුනා ගනු ලැබේ.

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල සියලුම අයිතම මුලින් මිලෙන් සටහන් වේ. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ අයිතම පසුව නැවත තක්සේරු කරන විට, එවැනි වත්කම්වල සම්පූර්ණ භාණ්ඩය සාධාරණ වටිනාකමකින් නැවත තක්සේරු කරනු ලැබේ. සමූහය මගින් ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා පිරිවැය

ආකෘතියක් දක්වා ඇති අතර, ඒ සම්බන්ධ ආනුෂංගික වියදම්, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත අගය අඩු වීම් අලාභ ද සමගින් මිලදී ගැනීම් හෝ ඉදිකිරීමේ පිරිවැයේ වාර්තා කරනු ලබයි. පවතින වටිනාකම නැවත අය කර ගත නො හැකි බව සිදුවීම් හෝ තත්වයන් වෙනස් වීම මගින් පෙන්නුම් කරන අවස්ථාවක අගය අඩු වීම සෙවීම සඳහා දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පවතින වටිනාකම් සමාලෝචනය කෙරේ. සමූහය විසින් ඉඩම් සහ ගොඩනැගිලි සඳහා නැවත තක්සේරු කිරීමේ ආකෘතිය යොදයි. අවම වශයෙන් සෑම වසර පහකට වරක් වත්කම් නැවත තක්සේරු කිරීමේ ප්‍රතිපත්තියක් සමූහය විසින් අනුගමනය කරනු ලැබේ.

ප්‍රති තක්සේරුවක ප්‍රතිඵලයක් ලෙස වත්කම්වල පවතින වටිනාකම ඉහල යන විට, එම ඉහළ යාම වෙනත් විස්තීරණ ආදායම තුල හඳුනා ගත යුතු අතර ප්‍රති තක්සේරුකරණ අතිරික්තය යන ශීර්ෂය යටතේ සාධාරණ ලෙස සමුච්චිත කළ යුතු ය.

නැවත තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වත්කමක පවතින වටිනාකම අඩු වූ විට, එම අඩුවීම ලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගත යුතු ය. කෙසේ වුව ද, එම වත්කමට අදාළ නැවත තක්සේරු කිරීමේ අතිරික්තයේ පවතින ඕනෑම ණය ශේෂයක ප්‍රමාණයට , එම අඩු වීම අනෙක් විස්තීර්ණ ආදායමෙහි හඳුනා ගත යුතු ය. අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනා ගෙන ඇති අඩු වීම මගින් ප්‍රතිතක්සේරුකරණ අතිරික්තය යන මාතෘකාව යටතේ සමානව එකතු වී ඇති මුදල අඩු කරනු ලබයි.

වත්කම හඳුනා නො ගත් විට, දේපල, පිරියත හෝ යන්ත්‍රෝපකරණ වල අයිතමයකට අදාළ ප්‍රතිතක්සේරුකරණ අතිරික්තය සෘජුව ම රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කළ හැකි ය.

### 3.8.2 සින්නක්කර වත්කම්

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ අයිතමයක මිල කෙරෙහි එහි මිලදී ගැනීමේ මිල සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩ කරන තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි පිරිවැය ඇතුළත් වේ. ස්වයං ව සෑදුණු වත්කම්වල (self constrcted assets) පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය සහ වත්කම අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුව ම ආරෝපණය කළ හැකි වෙනත් වියදම් ඇතුළත් වේ. අයිතම විසුරුවා හැරීමේ සහ ඉවත් කිරීමේ පිරිවැය සහ ඒවා පිහිටා ඇති වෙබ් අඩවියේ ප්‍රතිසාධනය කිරීම සහ සුදුසුකම් ලැබීමේ වත්කම් සම්බන්ධ වියදම් ණයට ගැනීම ද මෙයට ඇතුළත් ය.

ගනුදෙනුකරුවන්ගෙන් මාරු කරන ලද දේපල, පිරියත හා යන්ත්‍රෝපකරණ ප්‍රථමයෙන් ගණනය කරනු ලබන්නේ පාලනය ලබා ගන්නා දිනයේ සාධාරණ වටිනාකමට ය.

අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අනුකලනය කරන ලද මිල දී ගත් මෘදුකාංග, යන්ත්‍රෝපකරණ වල කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත.

දේපල, පිරියත හා යන්ත්‍රෝපකරණ යන අයිතමවල කොටස්වලට විවිධ ලෙස ප්‍රයෝජනවත් ආයු කාලයක් ඇති විට, ඒවා දේපල, පිරියත හා යන්ත්‍රෝපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගනු ලැබේ.

ස්වයංව සෑදුණු වත්කම්වල (self-constrcted assets) පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය සහ වත්කම ,අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුව ම ආරෝපණය කළ හැකි වෙනත් වියදම් ඇතුළත් වේ.

### 3.8.3 කල්බදු වත්කම්

හිමිකාරිත්වයේ සියළු ම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙසින් සමූහයට පැවරෙන කල් බදු මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික හඳුනා ගැනීමේ දී කල්බදු වත්කම් එහි සාධාරණ වටිනාකමට වඩා අඩු මුදලකට සහ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට සමාන මුදලකට ප්‍රාග්ධනිත කරනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසු ව, එම වත්කමට අදාළ කර ගත හැකි ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූල ව වත්කම ගිණුම්ගත කරනු ලැබේ.

### 3.8.4 පසුකාලීන වියදම්

අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ලැබිය හැකි වන්නේ නම්, දේපල පිරියත හා යන්ත්‍රෝපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය අයිතමයෙහි පවතින වටිනාකමෙහි හඳුනා ගනු ලබයි. එය සමූහය වෙත ගලා යන අතර එහි පිරිවැය විශ්වසනීය ව මැනිය හැකි ය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි පවතින වටිනාකම හඳුනා නො ගනී. දේපල පිරියත හා යන්ත්‍රෝපකරණවල එදිනෙදා සේවා සැපයීමේ දී දරනු ලැබූ පිරිවැය ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගැනේ.

### 3.8.5 හඳුනා නො ගැනීම

දේපල පිරියත හා යන්ත්‍රෝපකරණවල අයිතමයක පවතින වටිනාකම, අපහරණයක දී හෝ එහි භාවිතයෙන් හෝ අපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නො කරන විටක දී හඳුනා නො ගනී. හඳුනා නො ගැනීමේ ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

### 3.8.6 ක්ෂය වීම

දේපල පිරියත හා යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය ඔස්සේ සරල රේඛීය ක්‍රමය මඟින් ලාභ හෝ අලාභයෙහි ක්ෂය වීම හඳුනා ගනු ලැබේ. කල්බදු කාල සීමාව අවසානයේ දී සමූහයට හිමිකාරිත්වය ලැබෙනු ඇති බවට හේතුසාධක සහිත ව යම් සාධාරණ විශ්වාසයක් පවතින විට දී හැර කල්බදු වත්කම් කල්බදු කාල සීමාව කෙටි වීම සහ ඒවායේ ප්‍රයෝජ්‍ය ජීව ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ. භාවිතය සඳහා යොදා ගත

හැකි ව පවතින විට දී වත්කමක ක්ෂය වීම ආරම්භ වන අතර වත්කම විකිණීමට තබා ඇති (හෝ විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කරන ලද අපහරණ භාණ්ඩයට ඇතුළත් කර ඇති විට) ලෙස වර්ගීකරණය කළ දිනය සහ වත්කම හඳුනා නො ගන්නා දිනය යන දින දෙකෙන් මුල් දිනයට වත්කමක ක්‍රමක්ෂය අවසන් වේ. සින්නක්කර ඉඩම් සහ සිදු වෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් මත ක්‍රමක්ෂය අය නො වේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය පහත පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | ප්‍රයෝජ්‍ය ජීව කාලය (වසර) |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 13-14 |
| කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ සහ ඉදි කිරීම් | 5-8 |
| ඉදිකිරීම් මෙවලම් සහ උපකරණ | 4-5 |
| මෝටර් වාහන | 4 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 5 |
| කන්ටේනර | 5 |
| පරිගණක | 5 |
| පුස්තකාල පොත් | 8 |

වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජ්‍ය ජීව කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදී ම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පූර්ව ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, LKAS 08 ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස ගණන් ගත යුතු වේ.

### 3.8.7 සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්

වාර්තා කරන දිනට සම්පූර්ණ නො කළ වර්ෂය තුළ දරන ලද ප්‍රාග්ධන වියදම්, සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වා ඇති අතර වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද භාවිතයට ගත හැකි ව පවතින ප්‍රාග්ධන වත්කම් දේපල පිරියත හා යන්ත්‍රෝපකරණවලට මාරු කර ඇත.

### 3.9 කල්බදු දේපල

ඉඩම් පරිහරණ අයිතීන් ලබා ගැනීම සඳහා ගෙවන ලද පෙරගෙවුම් කල්බදු කුලී, කල්බදු කාල සීමාව තුළ ලබා දී ඇති ප්‍රතිලාභ රටාවට අනුකූල ව ක්ෂය කරනු ලැබේ. ඉඩම් පරිහරණ අයිතීන් ඇතුළත් සහ තක්සේරු කිරීමේ දී ප්‍රකාශ කරන ලද බදු දේපල ඉතිරි බදු කාලය තුළ සරල රේඛා පදනමක් මත ක්‍රමක්ෂිත කරනු ලැබේ. අගය අඩු වීමේ අලාභ තිබේ නම්, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙන් හඳුනා ගැනේ.

### 3.10 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කමක් යනු භාණ්ඩ හෝ වෙනත් සේවාවන් නිෂ්පාදනය හෝ සැපයීම හෝ අන් අයට කුලියට දීම හෝ පරිපාලනමය අරමුණු සඳහා යොදා ගන්නා වූ භෞතික ද්‍රව්‍ය නොමැති ව හඳුනා ගත හැකි මුදල්මය නො වන වත්කමකි. අස්පෘශ්‍ය වත්කමක් මුලින් හඳුනා ගනු ලබන්නේ පිරිවැයෙන් වන අතර අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යවසාය වෙත ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම්, වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි ය. මූලික හඳුනා ගැනීමෙන් පසු ව, අස්පෘශ්‍ය වත්කම්, ඕනෑම සමුච්චිත ක්‍රමක්ෂිත වීමක් සහ ඕනෑම සමුච්චිත අගය අඩු වීමේ අලාභයක අඩු වියදමකින් සිදු කෙරේ.

#### (අ) පරිගණක මෘදුකාංග

සමූහය විසින් භාවිතා කිරීම සඳහා බලපත්‍ර ලබා දී ඇත්තා වූ ද පිරිවැය දරනු ලබන්නා වූ ද පරිගණක මෘදුකාංග, ආශ්‍රිත දෘඩාංගවලට අවශ්‍යයෙන් ම සම්බන්ධ නොවන , පැහැදිලිව හඳුනා ගත හැකි, විශ්වාසනීය ලෙස මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභවලට තුඩු දෙනු ඇතැයි සිතිය හැකි, අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය යටතේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ඇතුළත් කර ඇත.

#### (ආ) ක්‍රමක්ෂ කිරීම

සීමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආර්ථිකමය ආයු කාලයට ඉහලින් ක්‍රමක්ෂය කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම් හි අගය අඩුවීමක් පිළිබඳ ව යම් ඇඟවීමක් ඇති විටක අගය අඩු වීම සම්බන්ධයෙන් තක්සේරු කෙරේ. අස්පෘශ්‍ය වත්කම් එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය ඔස්සේ, වත්කම භාවිතය සඳහා ලබා ගත හැකි වූ දින සිට ආදායම් ප්‍රකාශයේ සරල රේඛීය පදනමක් මත ක්‍රමක්ෂ කර ඇත. මෘදුකාංගයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය වසර 5 කි. සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂ කාල සීමාව සහ ක්‍රමක්ෂ ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ ම සමාලෝචනය කෙරේ. වත්කම විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කරන ලද හෝ වත්කම් හඳුනා නො ගන්න දින සිට ක්‍රමක්ෂය නතර කළ යුතු ය.

#### (ඇ) හඳුනා නො ගැනීම

අස්පෘශ්‍ය වත්කමක් අපහරණයක දී හෝ එහි භාවිතයෙන් හෝ අපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නො කරන විටක දී හඳුනා නො ගනී.

### 3.11 බඩු වට්ටෝරු

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමට අඩුවෙන් බඩු වට්ටෝරු තක්සේරු කරනු ලැබේ. පිරිවැය, බර තැබූ මධ්‍යන පිරිවැය පදනමින් නිශ්චය කරනු ලබන අතර එයට බඩු වට්ටෝරු අත්පත් කර ගැනීමට සහ ඒවා පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමේ දී දරන ලද වියදම් ඇතුළත් වේ.

### 3.12 සිදු කෙරෙමින් පවතින කාර්යයන්

වසර අවසානය වන විට සිදු කරන ලද බිල් නො කළ වැඩ සඳහා දරන ලද පිරිවැය, සිදු කෙරෙමින් පවතින කාර්යයන්ගෙන් නියෝජනය කෙරේ . එය මිනිනු ලබන්නේ බිල්පත් කිරීමේ (හෝ තක්සේරු කිරීමේ) අවසාන දිනයේ සිට මූල්‍ය වර්ෂයේ අවසානය දක්වා දරන ලද වියදම් ප්‍රමාණයෙනි. විශේෂිත ව්‍යාපෘති සඳහා සෘජුව ම අදාළ වන සියලුම වියදම් සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම් කර ගනිමින් සමූහයේ කොන්ත්‍රාත් කාර්යයන්හි දී දරන ලද ස්ථාවර සහ විචල්‍ය පොදු කාර්ය පිරිවැය වෙන් කිරීමක් පිරිවැයට ඇතුළත් වේ.

### 3.13 සේවක ප්‍රතිලාභ

#### (අ) අර්ථ දැක් වූ දායකත්ව සැලසුම්

අර්ථ දැක් වූ දායකත්ව සැලසුම යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර, ඒ යටතේ දායක මුදල් වෙනම අරමුදලකට යවනු ලබන අතර වැඩිදුර මුදල් ගෙවීම සඳහා ආයතනයට නෛතික හෝ සාධනීය වගකීමක් නොමැත. සේවකයින් විසින් සේවා සපයනු ලබන කාල පරිච්ඡේදවලදී අර්ථ දැක් වූ දායකත්ව සැලැස්මට දායක වීම සඳහා වන බැඳීම් සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස ලාභ හෝ අලාභයෙහි හඳුනා ගනු ලැබේ. අනාගත ගෙවීම්වල මුදල් ආපසු ගෙවීමක් හෝ අඩු කිරීමක් පවතින ප්‍රමාණයට පෙරගෙවුම් දායකත්වයන් වත්කමක් ලෙස පිළිගනු ලැබේ.

අර්ථ දැක් වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයන් අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුකූලව අදාළ දායක අරමුදල් මගින් ආවරණය වේ. සමූහය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් සේවකයන්ගේ දළ වැටුපෙන් 12% සහ 3% ක දායකත්වයක් දක්වනු ලැබේ.

#### (ආ) අර්ථ දැක් වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිත

අර්ථ දැක් වූ ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම වාර්තා කරන දිනයේ දී අර්ථ දැක් වූ ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම වේ. LKAS 19 - 'සේවක ප්‍රතිලාභී මගින් නිර්දේශිත පරිදි ව්‍යාපෘති ඒකක බැර ක්‍රමවේදය (PUC) භාවිතා කරමින් අර්ථ දැක් වූ ප්‍රතිලාභ බැඳීම ස්වාධීන ආයුගණකවරුන් විසින් වාර්ෂික ව ගණනය කරනු ලැබේ.අර්ථ දැක් වූ ප්‍රතිලාභ සැලසුම් සඳහා ආයුගණක ලාභ සහ අලාභ ඒවා සිදුවන කාල පරිච්ඡේදයේ දී වෙනත් විස්තීර්ණ ආදායම්වල සම්පූර්ණයෙන් හඳුනා ගනු ලැබේ.

අවම වශයෙන් සෑම වසර තුනකට වරක්වත් ආයුගණක තක්සේරුව සිදු කිරීමට සමූහය අපේක්ෂා කරයි.

අර්ථ දැක්වූ බැඳීමේ වර්තමාන වටිනාකම ලබා ගැනීම සඳහා අවශ්‍ය උපකල්පන සලකා බලමින් පාරිතෝෂික බැරකම ව්‍යාපෘති ඒකක බැර ක්‍රමවේදය (PUC) ක්‍රමය භාවිතා කරමින් අගය කරනු ලැබේ.

කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව, සේවකයෙකු සඳහා පාරිතෝෂික ගෙවීමේ වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණකි.

### 3.14 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ සාධනීය බැඳීමක් සමූහයට තිබේ නම් සහ එම බැඳීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇති බව පෙනී යන්නේ නම් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදන සහ බැඳීම් හඳුනා ගනු ලැබේ. මුදල්වල කාල වටිනාකමෙහි වෙළඳපල තක්සේරුව පිළිබිඹු කරන පූර්ව බදු වට්ටම් අනුපාතයකට සහ බැරකමට විශේෂිත වූ අවදානම භාවිතා කරමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම මගින් ප්‍රතිපාදන තීරණය කරනු ලැබේ. අවසන් කළ නො හැකි වට්ටම් කිරීම මූල්‍යමය පිරිවැයක් ලෙස හඳුනා ගනු ලැබේ.

### ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිත අවස්ථා

සමූහයේ ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිත බැරකම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන 30 හි අනාවරණය කර ඇත.

### 3.15 විස්තීරණ ආදායම් ප්‍රකාශය

#### 3.15.1 ආදායම

#### (අ) ඉදිකිරීම් ආදායම

SLFRS 15 - පාරිභෝගිකයින් සමඟ ගිවිසුම් වලින් ලැබෙන ආදායම අනුව, ඉදිකිරීම් ආදායම කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමේ අදියරට සමානුපාතික ව (ආදාන ක්‍රමය පදනම් ව) ලාභ හෝ අලාභ ප්‍රකාශයෙන් හඳුනා ගැනේ.

ආදාන ක්‍රමය යටතේ, සමස්ත අපේක්ෂිත යෙදවුම්වලට (ඇස්තමේන්තුගත පිරිවැය) සාපේක්ෂ ව කාර්ය සාධන වගකීම් තෘප්තිමත් කිරීම සඳහා සමූහයේ යෙදවුම් පදනම මත එම කාර්ය සාධන වගකීමේ තෘප්තියට අනුව ආදායම හඳුනා ගැනේ.

සම්මත තාක්ෂණික කමිටු (STC) අනුමැතිය ලැබීමට නියමිත ව්‍යාපෘති සඳහා, කොන්ත්‍රාත් ආදායම හඳුනා ගනු ලබන්නේ කොන්ත්‍රාත්තුවේ එකඟ වී ඇති මූලික ආදායමෙන් 90% ක ප්‍රමාණයකට සහ ඒවා ආදායම් උත්පාදනය කරනු ඇති සහ විශ්වාසනීය ව මැනිය හැකි ප්‍රමාණයට කොන්ත්‍රාත්තුවේ කාර්යයන් හි , හිමිකම් සහ දිරි දීමනා ගෙවීම්වල යම් වෙනස්කම් ඇති ප්‍රමාණයට ය. STC වෙතින් ලැබුණු පසු, STC අනුමත කොන්ත්‍රාත් ආදායම් අනුමැතියට අනුව කොන්ත්‍රාත් ආදායම සංශෝධනය කෙරේ. වෙනත් කොන්ත්‍රාත්තු සඳහා කොන්ත්‍රාත්තුවේ මිලට කොන්ත්‍රාත්තුවේ එකඟ වූ මූලික මුදල සහ කොන්ත්‍රාත්තුවේ කාර්යයේ යම් වෙනස්කම් ඇතුළත් වේ.

#### (ආ) උපදේශන සේවා

පහත ආකාරයට උපදේශන කොන්ත්‍රාත්තුවල ස්වභාවය, විෂය පථය, වටිනාකම සහ කාලසීමාව අනුව උපදේශන සේවා වලින් ලැබෙන ආදායම හඳුනා ගැනීම සිදු වේ.

■ නිම කිරීමේ අදියර ක්‍රමය

උපදේශන සේවා වලින් ලැබෙන ආදායම වාර්තා කරන දිනයේ දී ගනුදෙනුව අවසන් කර ඇති අදියරට සමානුපාතික ව හඳුනා ගැනේ. සිදු කරන ලද කාර්යය සමාලෝචනය කිරීමෙන් සම්පූර්ණ කර ඇති අදියර තක්සේරු කරනු ලැබේ.

■ ලදුපත් ක්‍රමය

කොන්ත්‍රාත්තුවක සම්පූර්ණ කර ඇති අදියර විශ්වාසදායක ලෙස තීරණය කළ නො හැකි උපදේශන සේවා වලින් ලැබෙන ආදායම ලදුපත් ක්‍රමය මඟින් හඳුනා ගැනේ.

■ එකතු කිරීමේ ක්‍රමය

"නඩත්තු ඉල්ලීම්" ව්‍යාපෘතිවලින් ලැබෙන ආදායම මුදල් එකතු කිරීමේ ක්‍රමවේදය මත හඳුනා ගනු ලැබේ.

#### 1.15.2 පොලී ආදායම

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන සියලු මූල්‍ය මෙවලම් සහ විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කර ඇති පොලියක් දරන මූල්‍යමය වත්කම් සඳහා ඵලදායී පොලී අනුපාතය (EIR) එනම් මූල්‍ය මෙවලමෙහි අපේක්ෂිත ආයු කාලය හෝ ඊට අඩු කාලයක් ඔස්සේ හෝ යෝග්‍ය අවස්ථාවලදී මූල්‍ය වත්කමමෙහි හෝ බැරකමෙහි ශුද්ධ පවතින වටිනාකමට අනාගත මුදල් ලැබීම් හෝ ගෙවීම් සත්‍ය වශයෙන් ම වට්ටම්ගත කරනු ලබන පොලී අනුපාතය භාවිතා කරමින් පොලී ආදායම හෝ වියදම වාර්තා කරනු ලැබේ. විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි මූල්‍ය ආදායමට පොලී ආදායම ඇතුළත් වේ.

#### 3.15.3 ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීමට කොටස් හිමියන්ගේ ඇති අයිතිය තහවුරු කළ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කරනු ලැබේ.

#### 3.15.4 වෙනත් ආදායම්

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ බැහැර කිරීමෙන් ලැබෙන ලාභය හෝ අලාභ, බැහැර කිරීමෙන් ලැබෙන ආදායම, වත්කම්වල පවතින වටිනාකම සහ ඒ ආශ්‍රිත වියදම් අඩු කිරීමෙන් පසු ව හඳුනා ගනු ලැබේ. විදේශ විනිමය ලාභ හා අලාභ ශුද්ධ පදනමින් වාර්තා කරනු ලබයි.

#### 3.15.5 වියදම් හඳුනාගැනීම

#### (අ) ඉදිකිරීම් සහ උපදේශන පිරිවැය

අනාගත කොන්ත්‍රාත් ක්‍රියාකාරකම්වලට අදාළ වත්කමක් නිර්මාණය කරන්නේ නම් මිස කොන්ත්‍රාත් වියදම් දැරීමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ මුළු පිරිවැය එහි ආදායම ඉක්මවා යාමට ඉඩ ඇති විට අපේක්ෂිත අලාභ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

#### (ආ) වෙනත් වියදම්

වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ කාර්යක්ෂම අයුරින් නඩත්තු කිරීමේදී දරන ලද සියලුම වියදම් ආදායමට එක් කර ඇත.

### 3.15.6 බදුකරණය

#### (අ) වත්මන් බදු

වත්මන් සහ පෙර කාලපරිච්ඡේද සඳහා වන වත්මන් ආදායම් බදු බැරකම් අය කර ගත හැකි බවට අපේක්ෂිත හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවන ලද ප්‍රමාණයට අගයනු ලැබේ. එම ප්‍රමාණය ගණනය කිරීමේ දී භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති පනවනු ලබන හෝ වාර්තා කරන දිනයේ දී පනවන ලද ඒවා වේ.

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන, මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති ආදායම් සහ වියදම්වල මූලිකාංග මත පදනම් ව සහ දේශීය ආදයම් පනතේ ප්‍රතිපාදනවලට අනුකූල ව ගණනය කර ඇත.

අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල අනාවරණය කර ඇත.

#### (ආ) විලම්භිත බද්ද

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාව සඳහා වත්කම් සහ බැරකම්වල පවතින වටිනාකම් සහ බදුකරණ අවශ්‍යතා සඳහා යොදා ගන්නා ලද වටිනාකම් අතර තාවකාලික වෙනස්කම්වලට අදාල ව විලම්භිත බදු හඳුනා ගනු ලැබේ.

පහත සඳහන් දෑ සඳහා විලම්භිත බදු හඳුනා නො ගනී:

- ව්‍යාපාර සංයෝජනයක් නො වන සහ ගිණුම්කරණයට හෝ බදු අය කළ හැකි ලාබයට අලාභයට බලපෑම් ඇති නො කරන ගනුදෙනුවක දී වත්කම් හෝ බැරකම්වල මූලික හඳුනා ගැනීම මත තාවකාලික වෙනස්කම්;
- නුදුරු අනාගතයේදී ප්‍රතිවර්ත නො වනු ඇති බවට අදහස් කරනු ලබන ප්‍රමාණයට අනුබද්ධිත ආයතනවල සහ ඒකාබද්ධව පාලනය වන ආයතනවල ආයෝජන සම්බන්ධ තාවකාලික වෙනස්කම්; හා
- කීර්තිනාමය ආරම්භයේදී හඳුනා ගැනීම මත පැන නගින බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම්.

  වාර්තා කරන දිනයට පනවන ලද හෝ නිත්‍ය වශයෙන් පනවා ඇති නීති පදනම් කර ගනිමින් ඒවා ප්‍රතිවර්ත වන විට තාවකාලික වෙනස්කම් සඳහා යොදා ගත හැකි යැයි අපේක්ෂිත බදු අනුපාතයට විලම්භිත බදු අගයනු ලැබේ.

### 4. සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය

සාමාන්‍ය ව්‍යාපාර කොටස් සම කොටස් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාමාන්‍ය ව්‍යාපාර කොටස් නිකුතුවට සෘජුව ම ආරෝපණය කළ හැකි වර්ධක පිරිවැය කවර හෝ බදු අය කිරීමක් හැර සම කොටස් වලින් අඩු කිරීමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 5. අඛණ්ඩ පැවැත්ම

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් ඇගයීමක් සිදු කර ඇති අතර, ප්‍රත්‍යාසන්න අනාගතය සඳහා ව්‍යාපාර සිදු කරගෙන යාමට සම්පත් ප්‍රමාණවත්ව පවතින බවට සෑහීමකට පත් වී ඇත. තවද, අඛණ්ඩ ව ඉදිරියට යාම සඳහා සමූහයේ හැකියාව පිළිබඳ ව සැකයක් ඇති කළ හැකි තරම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳ ව කළමනාකාරීත්වය දැනුවත් වී නොමැත. එබැවින්, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනමින් සකස් කිරීම සිදු කරගෙන යනු ලැබේ.

### 6. සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු

මුදලක් අය කරනු ලබන්නේ ද යන්න නොසලකමින්, එක් පාර්ශ්වයකට පාලනය කිරීමේ හැකියාව පවතින හෝ සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි අනෙක් පාර්ශ්වයේ මූල්‍යමය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති/තීරණ පිළිබඳ ගනුදෙනු සම්බන්ධයෙන් අනාවරණය කිරීම් සිදු කර ඇත. අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 27 හි අනාවරණය කර ඇත.

### 7. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය LKAS 7 - මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන අනුව වක්‍ර ක්‍රමවේදය භාවිතා කිරීමෙන් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.

### 8. වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදු වන සිදුවීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති දිනය අතර සිදුවන හිතකර හෝ අහිතකර සිදුවීම් වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව සිදු වන සිදුවීම් වේ.

වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම්වල වැදගත්භාවය සලකා බලනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| 2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | සමූහය | | ඉ.කා.ම.උ.කා | |
|---|---|---|---|---|---|
| | | 2019<br>රු. | 2018<br>රු. | 2019<br>රු. | 2018<br>රු. |
| **ආදායම** | 9 | **13,150,718,975** | 14,273,155,935 | **7,548,165,387** | 9,667,271,046 |
| විකුණුම් පිරිවැය | 10 | (11,764,257,425) | (12,408,766,802) | (6,971,370,106) | (8,620,274,575) |
| **දළ ලාභය** | | **1,386,461,550** | **1,864,389,133** | **576,795,281** | **1,046,996,471** |
| වෙනත් ආදායම් | 11 | 202,839,680 | 194,774,286 | 170,110,297 | 156,941,619 |
| පරිපාලන වියදම් | | (1,451,346,051) | (1,474,518,729) | (668,489,960) | (689,012,073) |
| විකුණුම් සහ සහ බෙදා හැරීමේ පිරිවැය | | (52,706,532) | (282,120,820) | (48,715,865) | (279,559,063) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබීම්** | | **85,248,647** | **302,523,870** | **29,699,752** | **235,366,954** |
| මූල්‍ය ආදායම | | 506,143,480 | 453,739,544 | 314,400,265 | 303,565,802 |
| මූල්‍ය පිරිවැය | | (44,602,963) | (56,980,423) | (4,162,901) | (12,740,273) |
| **ශුද්ධ මූල්‍ය  ආදායම** | 12 | **461,540,517** | **396,759,121** | **310,237,364** | **290,825,529** |
| **බදු පෙර ලාභය** | | **546,789,164** | **699,282,991** | **339,937,117** | **526,192,483** |
| ආදායම් බදු වියදම් | 14 | (201,424,594) | (173,485,949) | (136,038,213) | (121,848,247) |
| **වර්ෂය සඳහා ලාභය** | | **345,364,570** | **525,797,042** | **203,898,903** | **404,344,237** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්**<br>**ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය නොකරන අයිතම** | | | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැරකම් නැවත මැනීම | 24 | (7,369,310) | (13,400,876) | (7,009,403) | (12,717,770) |
| ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම | 28 | 483,930,941 | 119,386,358 | 483,930,941 | 119,386,358 |
| අදාළ බදු | 25 | (169,776,684) | - | (169,776,684) | - |
| **බදු හැර වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම** | | **306,784,948** | **105,985,482** | **307,144,855** | **106,668,588** |
| **බදු හැර වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **652,149,518** | **631,782,524** | **511,043,758** | **511,012,824** |

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින්  අඩු කිරීම් නිරූපණය කරයි.

පිටු අංක 29 සිට 38 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| 2019 දෙසැම්බර් 31 දිනට | සටහන් | සමූහය 2019 රු. | සමූහය 2018 රු. | ඉ.කා.ම.උ.කා 2019 රු. | ඉ.කා.ම.උ.කා 2018 රු. |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 15 | **3,231,130,105** | 2,823,088,623 | **2,773,136,175** | 2,387,873,408 |
| කල්බදු වත්කම් | 16 | **87,598,676** | 74,948,240 | **72,422,750** | 74,948,240 |
| අස්පෘශ්‍ය වත්කම් | 17 | **7,642,750** | 8,574,369 | **7,642,750** | 8,574,369 |
| ආයෝජන | 18 | **55,216,573** | 52,634,700 | **65,216,593** | 62,634,720 |
| විලම්භිත බදු | 25 | **-** | - | | 25,274,627 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **3,381,588,105** | **2,959,245,932** | **2,918,418,269** | **2,559,305,365** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය (ඉන්වෙන්ටරි) | 19 | **737,855,759** | 756,031,502 | **10,741,039** | 10,727,067 |
| කෙරෙමින් පවතින කාර්යයන් | 19 | **79,938,521** | 458,346,685 | **-** | - |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ | 20 | **13,357,590,461** | 12,092,206,764 | **11,741,494,084** | 11,485,297,537 |
| කෙටි කාලීන ආයෝජන | 18 | **4,868,452,606** | 5,176,600,458 | **3,108,471,017** | 3,191,494,525 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 22 | **568,539,381** | 865,760,048 | **257,291,253** | 537,695,214 |
| සම්බන්ධිත පාර්ශව සමාගම් වලින් හිඟ මුදල් | 21 | **-** | - | **1,600,196,674** | 1,588,871,719 |
| **මුළු ජංගම වත්කම්** | | **19,612,376,729** | 19,348,945,457 | **16,718,194,067** | 16,814,086,063 |
| **මුළු වත්කම්** | | **22,993,964,834** | **22,308,191,389** | **19,636,612,336** | **19,373,391,428** |
| **සමකොටස් සහ බැරකම්** | | | | | |
| දායක ප්‍රාග්ධනය | | **500,000** | 500,000 | **500,000** | 500,000 |
| ප්‍රාග්ධන සංචිත | 28 | **88,277,000** | 3,028,000 | **88,277,000** | 3,028,000 |
| ප්‍රත්‍යාගණන සංචිත | | **518,068,300** | 119,386,358 | **518,068,300** | 119,386,358 |
| රඳවාගත් ඉපැයුම් | | **6,234,940,310** | 6,086,973,711 | **5,640,074,835** | 5,675,860,567 |
| **මුළු සමකොටස්** | | **6,841,785,609** | **6,209,888,069** | **6,246,920,134** | **5,798,774,925** |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| කල්බදු ණය හිමියන් | 23 | **-** | - | **-** | - |
| සේවක ප්‍රතිලාභ බැඳීම් | 24 | **180,974,438** | 176,869,571 | **167,903,375** | 168,341,721 |
| විලම්බිත බදු | 25 | **200,932,489** | 6,887,518 | **159,166,864** | - |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **381,906,927** | **183,757,088** | **327,070,239** | **168,341,721** |
| **ජංගම බැරකම්** | | | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ | 26 | **14,888,563,947** | 14,909,461,179 | **12,190,521,650** | 12,479,623,765 |
| ගෙවිය යුතු ආදායම් බදු | 27 | **881,708,352** | 974,665,375 | **872,100,313** | 926,651,017 |
| කල්බදු ණය හිමියන් | 23 | **-** | - | **-** | - |
| බැංකු අයිරා | 22 | **-** | 30,419,679 | **-** | - |
| **මුළු ජංගම බැරකම්** | | **15,770,272,298** | 15,914,546,232 | **13,062,621,963** | 13,406,274,782 |
| **මුළු බැරකම්** | | **16,152,179,226** | 16,098,303,321 | **13,389,692,201** | 13,574,616,503 |
| **මුළු සමකොටස් සහ බැරකම්** | | **22,993,964,834** | **22,308,191,389** | **19,636,612,336** | **19,373,391,428** |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් නිරූපනය කරයි.

පිටු අංක 29 සිට 38 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට (LKAS සහ SLFRS) අනුකූල ව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව සහතික කර ඇත.

**ඩී. මාබෝපිටිය**
මූල්‍ය කළමනාකරු

**ඉංජිනේරු ටී.ඩී. වික්‍රමරත්න**
සාමාන්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලැබේ. අධ්‍යක්‍ෂක මණ්ඩලය වෙනුවෙන් සහ ඒ සඳහා අනුමත කර අත්සන් කරමු.

**ඉංජිනේරු ටී.පී.යූ.එස්. කරුණාරත්න**
සභාපති

**ඉංජිනේරු එන්.එස්. ද සිල්වා**
අධ්‍යක්ෂ

2020 පෙබරවාරි 28
කොළඹ

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ඉ.කා.ම.උ.කා | | | | |
|---|---|---|---|---|---|
| **2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා** | **දායක ප්‍රාග්ධනය රු.** | **ප්‍රාග්ධන සංචිත රු.** | **ප්‍රත්‍යාගණන සංචිත රු.** | **රඳවා ගත් ඉපැයීම් රු.** | **එකතුව රු.** |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | - | 5,599,699,524 | **5,603,227,524** |
| SLFRS 09 හි බලපෑම | - | - | - | (315,465,422) | **(315,465,422)** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | 404,344,235 | **404,344,235** |
| බදු හැර වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | 119,386,358 | (12,717,770) | **106,668,588** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 119,386,358 | 5,675,860,567 | **5,798,774,925** |
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 119,386,358 | 5,675,860,567 | **5,798,774,925** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | 203,898,904 | **203,898,904** |
| බදු හැර වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | - | 85,249,000 | 398,681,942 | (176,786,087) | **307,144,855** |
| පෙර වර්ෂයේ ගැලපීම | - | - | - | (62,898,549) | **(62,898,549)** |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **500,000** | **88,277,000** | **518,068,300** | **5,640,074,835** | **6,246,920,134** |

| | සමූහය | | | | |
|---|---|---|---|---|---|
| **2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා** | **දායක ප්‍රාග්ධනය රු.** | **ප්‍රාග්ධන සංචිත රු.** | **ප්‍රත්‍යාගණන සංචිත රු.** | **රඳවා ගත් ඉපැයීම් රු.** | **එකතුව රු.** |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | - | 6,012,648,538 | **6,016,176,538** |
| SLFRS 09 හි බලපෑම | - | - | - | (418,575,506) | **(418,575,506)** |
| SLFRS 15 හි බලපෑම | - | - | - | (19,495,485) | **(19,495,485)** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | 525,797,040 | **525,797,040** |
| බදු හැර වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | 119,386,358 | (13,400,876) | **105,985,482** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 119,386,358 | 6,086,973,711 | **6,209,888,069** |
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | 500,000 | 3,028,000 | 119,386,358 | 6,086,973,711 | **6,209,888,069** |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | 345,364,570 | **345,364,570** |
| බදු හැර වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | - | 85,249,000 | 398,681,942 | (177,145,994) | **306,784,948** |
| පෙර වර්ෂයේ ගැලපීම් සටහන | - | - | - | (20,251,978) | **(20,251,978)** |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **500,000** | **88,277,000** | **518,068,300** | **6,234,940,310** | **6,841,785,609** |

පිටු අංක 29 සිට 38 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

**සටහන**

අනුබද්ධ සමාගමක් වන මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම විසින් රුපියල් 47,273,083 ක බිල් නොකළ පිරිවැය CECB විසින් 2018 වර්ෂයේදී ද හඳුනා නොගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2018 මූල්‍ය ප්‍රකාශනවල CECB හි ආදායම එම ප්‍රමාණය ම ඉක්මවා දක්වා ඇත. මෙම බලපෑම 2019 ජනවාරි 1 වන දිනට රඳවා ගත් ඉපැයීම්වලට ගලපන ලදී.

EPC සබරගමුව සහ දිගන මූලික කාර්යාලය විසින් හඳුනා ගත් ආදායම ද්විත්ව ගණනය කිරීම හේතුවෙන් වූ ගිණුම්කරණ අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා 2019 අගෝස්තු 29 සහ 2019 නොවැම්බර් 11 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව සබරගමුව බේස් වෙතින් රුපියල් 9,001,369 ක් සහ දිගන බේස් වෙතින් රුපියල් 6,624,097 ක් 2019 ජනවාරි 1 වන දිනට රඳවා ගත් ඉපැයීම්වල ආරම්භක ශේෂයට ගලපන ලදී.

රු.20,191,994/- ක්ෂයවීම් අනුපාතවල දෝෂය LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂයන්ට අනුකූලව ගලපන ලදී.

රු. 22,454,577/-පසුගිය වර්ෂයේ ආදායම් බදු වගකීම් වෙනස්වීම්, රඳවාගත් ඉපැයීම් වලට ගලපන ලදී.

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය | | ඉ.කා.ම.උ.කා | |
|---|---|---|---|---|
| | 2019<br>රු. | 2018<br>රු. | 2019<br>රු. | 2018<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| බදු පෙර ලාභය | **546,789,164** | 699,282,990 | **339,937,117** | 526,192,483 |
| **ගැලපීම්:** | | | | |
| දේපල,පිරියත සහ යන්ත්‍රෝපකරණ මත ක්ෂයවීම | **289,533,080** | 299,773,201 | **131,799,788** | 134,083,957 |
| කල්බදු දේපල ක්‍රමක්ෂය | **2,774,830** | 816,460 | **2,525,490** | 816,460 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | **931,619** | 242,659 | **931,619** | 242,659 |
| බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | **60,479,303** | 389,033,237 | **60,479,303** | 277,231,249 |
| බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රත්‍යාවර්තනය | **(168,618,526)** | (72,504,955) | **(168,618,526)** | (65,154,187) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන /(ප්‍රත්‍යාවර්තනය) | **43,696,847** | 34,309,745 | **38,747,565** | 30,611,576 |
| ශුද්ධ මූල්‍ය ආදායම | **(461,540,517)** | (396,759,121) | **(310,237,364)** | (290,825,529) |
| පෙර කාල පරිච්ඡේදයේ ගැලපීම් | **(62,898,549)** | (438,070,992) | **(62,898,549)** | (315,465,422) |
| දේපල,පිරියත සහ යන්ත්‍රෝපකරණ බැහැර කිරීමේදී (ලාභ) /අලාභ | **(35,247,146)** | (6,341,543) | **(35,094,259)** | (8,021,800) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **215,900,107** | **509,781,682** | **(2,427,816)** | **289,711,446** |
| තොගය (වැඩිවීම)/අඩුවීම | **18,175,743** | 76,817,702 | **(13,972)** | (88,566) |
| කෙරෙමින් පවතින කාර්යයන් (වැඩිවීම)/ අඩුවීම | **378,408,163** | (458,346,685) | **-** | - |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | **(1,157,244,478)** | 2,370,267,367 | **(148,057,328)** | 2,703,546,745 |
| සම්බන්ධිත සමාගම් වලින් හිඟව පවතින මුදල් (වැඩිවීම)/ අඩුවීම | **-** | - | **(11,324,955)** | (23,249,982) |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ වැඩිවීම/(අඩුවීම) | **(20,897,232)** | (1,215,413,890) | **(289,102,114)** | 2,677,269,800 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල්** | **(565,657,694)** | **1,283,106,180** | **(450,926,186)** | **292,649,843** |
| ගෙවන ලද පොලී | **(44,602,963)** | (56,980,423) | **(4,162,901)** | (12,740,273) |
| ගෙවන ලද බදු | **(247,658,753)** | (186,908,087) | **(175,924,111)** | (155,363,347) |
| ගෙවන ලද පාරිතෝෂික | **(46,961,290)** | (36,661,398) | **(46,195,314)** | (36,229,968) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්** | **(904,880,701)** | **1,002,556,270** | **(677,208,508)** | **88,316,259** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය** | | | | |
| දේපල,පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා ආයෝජනය | **(188,166,176)** | (148,954,032) | **(32,515,012)** | (29,074,572) |
| සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් සඳහා ආයෝජනය | **(10,823,871)** | (1,918,836) | **(5,493,650)** | (885,596) |
| කල්බදු දේපල සඳහා ආයෝජනය | **(15,425,266)** | (75,764,700) | **-** | (75,764,700) |
| අස්පෘශ්‍ය වත්කම් සඳහා ආයෝජනය | **-** | (8,817,028) | **-** | (8,817,028) |
| දේපල,පිරියත සහ යන්ත්‍රෝපකරණ බැහැරකිරීම මත විකුණුම් ලැබීම | **40,785,567** | 6,441,081 | **39,971,308** | 8,121,338 |
| දිගුකාලීන තැන්පතු ආයෝජනය / බැහැර කිරීම | **(2,581,873)** | (1,516,851) | **(2,581,873)** | (1,516,851) |
| කෙටි කාලීන තැන්පතු ආයෝජනය / බැහැර කිරීම | **308,147,852** | (1,082,065,512) | **83,023,508** | (208,030,603) |
| පොලී ආදායම | **506,143,480** | 453,739,544 | **314,400,265** | 303,565,802 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **638,079,713** | **(858,856,334)** | **396,804,547** | **(12,402,211)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රවාහ** | | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **-** | - | **-** | - |
| මුදල් සහ මුදල් සමාන දෑ වල අගයන් වැඩි වීම/(අඩුවීම) | **(266,800,988)** | 143,699,936 | **(280,403,961)** | 75,914,048 |
| ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | **835,340,369** | 691,640,433 | **537,695,214** | 461,781,166 |
| **අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 22)** | **568,539,381** | **835,340,369** | **257,291,253** | **537,695,214** |

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩු කිරීම් නිරූපනය කරයි.

පිටු අංක 29 සිට 38 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

| 2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | | සමූහය | | ඉ.කා.ම.උ.කා | |
|---|---|---|---|---|---|
| | | 2019<br>රු. | 2018<br>රු. | 2019<br>රු. | 2018<br>රු. |
| **9.** | **ආදායම** | | | | |
| | ඉදිකිරීම් ආදායම | **10,746,508,980** | 11,654,948,124 | **5,128,317,093** | 7,032,813,248 |
| | උපදේශන ආදායම | **2,404,209,995** | 2,618,207,811 | **2,419,848,294** | 2,634,457,798 |
| | | **13,150,718,975** | **14,273,155,935** | **7,548,165,387** | **9,667,271,046** |
| **10.** | **විකුණුම් පිරිවැය** | | | | |
| | ඉදිකිරීම් පිරිවැය | **9,754,052,324** | 10,481,738,103 | **4,949,824,168** | 6,663,856,201 |
| | උපදේශන පිරිවැය | **2,010,205,100** | 1,927,028,699 | **2,021,545,938** | 1,956,418,374 |
| | | **11,764,257,425** | **12,408,766,802** | **6,971,370,106** | **8,620,274,575** |
| **11.** | **වෙනත් ආදායම්** | | | | |
| | විවිධ ආදායම් | **95,679,051** | 54,894,769 | **39,825,850** | 18,464,616 |
| | කුලියට දීමේ ආදායම් | **29,542,067** | 48,904,941 | **23,066,009** | 21,261,899 |
| | ජ/නොවන වත්කම් බැහැර කිරීමෙන් ලත් ආදායම් | **35,513,901** | 6,346,956 | **35,361,015** | 8,027,213 |
| | ප්‍රතිපූර්ණය කළ හැකි පිරිවැය | **-** | - | **31,688,710** | 31,911,041 |
| | විදේශ විනිමය ලාභය/(අලාභය) | **(274,274)** | 12,122,665 | **(274,274)** | 12,122,665 |
| | බොල් ණය ප්‍රතිපාදන ප්‍රත්‍යාවර්තනය | **40,442,987** | 72,504,955 | **40,442,987** | 65,154,187 |
| | වට්ටම් ආදායම | **1,935,949** | - | **-** | - |
| | | **202,839,680** | **194,774,286** | **170,110,297** | **156,941,619** |
| **12.** | **ශුද්ධ මූල්‍ය ආදායම** | | | | |
| | **මූල්‍ය ආදායම** | | | | |
| | පොලී ආදායම | **506,143,480** | 453,739,544 | **314,400,265** | 303,565,802 |
| | | **506,143,480** | **453,739,544** | **314,400,265** | **303,565,802** |
| **13.** | **මූල්‍ය පිරිවැය** | | | | |
| | පොලී වියදම් | **(44,602,963)** | (56,980,423) | **(4,162,901)** | (12,740,273) |
| | මූල්‍ය පිරිවැය | **(44,602,963)** | (56,980,423) | **(4,162,901)** | (12,740,273) |
| | ශුද්ධ මූල්‍ය ආදායම | **461,540,517** | **396,759,121** | **310,237,364** | **290,825,529** |
| **14.** | **ආදායම් බදු** | | | | |
| **14.1** | **වර්තමාන බදු වියදම** | **177,156,306** | 189,179,614 | **121,373,406** | 147,122,874 |
| | විලම්බිත බදු ප්‍රතිපාදන | **24,268,287** | (15,693,664) | **14,664,807** | (25,274,627) |
| | | **201,424,594** | **173,485,950** | **136,038,213** | **121,848,247** |
| **14.2** | **ගිණුම්කරණ ලාභය බදුකරණ ලාභයට සැසඳීම** | | | | |
| | ඉදිකිරීම් ආදායම මත බදු 28% | **-** | - | **-** | - |
| | ඉදිකිරීම් හැර වෙනත් ආදායම් මත බදු | **177,156,306** | 189,179,614 | **121,373,406** | 147,122,874 |
| | ලාභාංශ බදු | **-** | - | **-** | - |
| | වර්තමාන ආදායම් බදු වියදම් | **177,156,306** | **189,179,614** | **121,373,406** | **147,122,874** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට)

**2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා**

**15. දේපල,පිරියත සහ යන්ත්‍රෝපකරණ**

### 15.1 ඉ.කා.ම.උ.කා

| | ඉඩම් | ගොඩනැගිලි | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | ඉදිකිරීම්, මෙවලම් සහ උපකරණ | කාර්යාලයීය උපකරණ | පැල සහ යන්ත්‍රෝපකරණ | කන්ටේනර් | පරිඝණක | මෝටර් වාහන | පුස්ථකාල පොත් | කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
සිදු කරන ලද ක්‍රියා පටිපාටි මත  සහ ලබාගත් සාක්ෂි ද්‍රව්‍යමය කරුණු වලට සීමා වීම මත පදනම්ව,

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වැනි වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව, කාර්යාංශයේ පාලක මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකුට සාමාන්‍ය ව්‍යාපාරයට බැහැර ව කාර්යාංශය විසින් ඇති කර ගත් ඕනෑම කොන්ත්‍රාත්තුවක් සඳහා සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව පැවසීමටත්

- යම් අදාල නීතියකට හෝ කාර්යාංශයේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානයකට අනුකූල නොවන ලෙස කාර්‍යාංශය හෝ සමූහය ක්‍රියා කර ඇති බව පැවසීමට කිසිවක් (පහත සිදුවීම් හැර) මාගේ අවධානයට ලක් නොවිණි.

| නීතිරීති රෙගුලාසි සඳහා යොමුව | විස්තරය |
|---|---|
| අ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 10 සහ 11 වගන්ති සහ 2018 නොවැම්බර් 14 දිනැති හා අංක 02/2018 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) ඉල්ලා තිබූ පරිදි ද්‍රාව්‍යතා පරීක්ෂාවක් සිදු කිරීමෙන් පසු කාර්යාංශය විසින් ශුද්ධ අතිරික්තයේ ඉතිරි ව ඇති රු. 203,898,903 ක මුදල ඒකාබද්ධ අරමුදල වෙත ගෙවා නො තිබුණි. ඒ අතර, මහා භාණ්ඩාගාරය විසින් 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 5,640ක්වූ රඳවා ගත් ඉපැයීම්වලින් රු. මිලියන 75ක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබුනත් එයින් රු. මිලියන 25ක් පමණක් යවා තිබුණි.<br><br>(ii) අවශ්‍ය අනුමැතීන් ලබා නොගෙන රු. 3,173,687,610 ක මුදලක් කෙටි කාලීන හා දිගු කාලීන ආයෝජන ප්‍රභවයන් වන ඇමතුම් තැන්පතු සහ ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. |
| ආ) 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 03/2015න් සංශෝධිත මූල්‍ය රෙගුලාසි 371 සහ කාර්යාංශයේ මූල්‍ය අධිකාරිය පැවරීම | විවිධ අරමුණු සඳහා ලබා දෙන ලද අත්තිකාරම් හි එකතුව වූ රු.6741300 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් වසර තුනක් පුරාවට නිරාකරණය කර හෝ පියවා නො තිබීම. |
| ඇ) රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 2 දිනැති හා අංක පීඊ/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br><br>(i) 8.8.ඡේදය<br><br>(ii) 9.3.1.ඡේදය | වියදම් සීමාවන් පැනවීම ඇතුළුව අධිකාරී බලතල පැවරීම සඳහා වාර්ෂික ව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නො තිබූ අතර, එම අධිකාරී බලය පැවරීම සෑම වර්ෂයකම ආරම්භයේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යාවත්කාලීන කර අනුමත කර නො තිබුණි.<br><br>කාර්‍යාංශය තුළ අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමයක් තිබිය යුතු වුව ද එවැනි යෝජනා ක්‍රමයක් 2020 ජුනි 30 වන විටත් මධ්‍යම හා ඉහළ මට්ටමේ තනතුරු සඳහා පිළියෙල කර අනුමත කර ගෙන නො තිබුණි. |

| | |
|---|---|
| ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 හි 4.2 මාර්ගෝපදේශ | අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා සැලසුම් කරන ලද ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කිරීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. |
| ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති හා අංක 30/206 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වන ඡේදය | එක් ඉන්ධන පරීක්ෂාවකින් මාස 12 ක කාල පරිච්ඡේදයකට පසු ව හෝ කි.මී.25000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් අනතුරු ව හෝ වාහනයේ එන්ජිමට ප්‍රධාන අලුත්වැඩියාවක් සිදු කිරීමෙන් පසුව හෝ යනාදියෙන් කවරක් හෝ ප්‍රථමයෙන් සිදු වූ විට දී ඉන්ධන පරිභෝජනය නැවත පරීක්ෂා කළ යුතු ය. කෙසේ වුව ද, කාර්යංශයේ වාහන 347ක් සඳහා මෙම ක්‍රමවේදය අනුගමනය කර නො තිබුණි. |
| ඊ) කාර්යාංශයේ පරිපාලන කාර්ය පරිපාටියෙහි X පරිච්ඡේදය | (i) නිල නිවාසවල ජල හා විදුලි බිල්පත් අදාල නිවැසියන් විසින් ගෙවිය යුතු වුව ද , කාර්යාංශයේ පරිපාලන කාර්ය පරිපාටියෙහි විධිවිධානවලට පටහැනි ව සරණ මාවතේ පිහිටි නිල නිවාස 5ක් හා කුලී පදනම මත ලබා ගත් තවත් නිවාස 8 කට අදාල ආසන්න වශයෙන් රු. 1804846ක ජල හා විදුලි බිල්පත් සමාලෝචිත වර්ෂයේදී කාර්යාංශය විසින් ගෙවා තිබීම නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය විය.<br><br>(ii) එවකට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2015 ජනවාරි සිට 2019 මැයි දක්වා නිල නිවස (ඍ-4) අය කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. මීට අමතර ව, ජල බිල්පත්, විදුලි බිල්පත් සහ රූපවාහිනී සේවා බිල්පත් සඳහා දළ වශයෙන් රු. 900,000ක් 2020 ජූනි 30 වන දින වන විටත් ඔහුගෙන් අය කර ගැනීමකින් තොර ව කාර්යාංශය විසින් ගෙවා තිබුණි.<br><br>(iii) කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන නිලධාරීන් සඳහා නිල නිවාස ලබා දීමට ප්‍රතිපාදන නොමැති වුව ද මෙම නිලධාරීන් වෙනුවෙන් කුලී පදනම මත පෞද්ගලික පාර්ශවකරුවන්ගෙන් නිල නිවාස 2ක් ලබා ගෙන ඇති අතර සමාලෝචිත වර්ෂයේ දී කුලිය ලෙස රු.2760000ක මුදලක් කාර්යාංශය විසින් ගෙවා තිබුණි. |
| උ) 2018 ජූලි 18 දිනැති හා අංක 03/2018 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II වන ඡේදය | මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොර ව තනතුරු 09ක් සඳහා නිලධාරීන් පනස් අට දෙනෙකු බඳවාගෙන තිබුණි. |

### 3. වෙනත් සුවිශේෂී විගණන නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂයේ දී කාර්යාංශය විසින් රු 197,137,979ක අලාභයක් සහිත ව ඉදිකිරීම් ව්‍යාපෘති 31ක් නිම කර තිබූ අතර එයින් කාර්යාංශයේ පරිපාලිත සමාගම් වෙත උපකොන්ත්‍රාත්තු ලබා දී තිබූ ව්‍යාපෘති 14ක් රු. 52,278,277ක අලාභයක් සහිතව නිම කර තිබුණි.

(ආ) කාර්යාංශයේ ප්‍රදේශිය මූලික කාර්යාල සහ අංශ 05ක් පසුගිය වසර කිහිපයක සිට අඛණ්ඩ ව මෙහෙයුම් අලාභයක් සහිත ව ක්‍රියාත්මක වෙමින් පැවතුණු අතර සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂ දෙකෙහි ලැබූ අලාබයේ එකතුව රු. මිලියන 142කි. ඉහත කරුණට අමතර ව, කාර්යාංශයේ තවත් එනම් ජාවත්ත, සබරගමුව, DHQC, NRM & LS හා නැගෙනහිර දකුණ යන මූලික කාර්යාල 05ක් (ටී.පී.සී හා උපදේශක සේවා) සමාලොචිත වර්ෂයේ දී රු. මිලියන 35.87ක අලාභ පිට ක්‍රියාත්මක වී තිබුණි.

(ඇ) කාරයාංශය  මේ වන විට කිසිදු ඉදිකිරීම් කටයුත්තක නිරත වී නොමැති හෙයින් ඉන්ජිනේරුවරුන් 476ක් ද ඇතුළුව ආසන්න වශයෙන් සේවකයන් 1360 දෙනෙකු සේවයේ යොදවා ගැනීමේ උපදේශක ආදායම ලෙස රු. 2,429,848,294 ක් පමණක් උපයාගෙන තිබුණි.

(ඈ) කාර්යාංශයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්තක් නොවන කෙටිකාලීන හා දිගු කාලීන ආයෝජන මාර්ග වල සිදු කරන ලද රු. මිලියන 3,173,69ක ආයෝජන වලින් සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 314.40 ක පොලී ආදායමක් උපයා තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභයෙන්  92.5%(2018 - 68.18%)ක් නියෝජනය කර තිබුණි.

(ඉ) කාර්යාංශය විසින් උපදේශක සේවා සපයනු ලබන හා 2019 වර්ෂයට පෙර නිම කළ යුතු රු. මිලියන 18.762ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘති 23ක් විගණන දිනය වන 2019 ජුනි 30 වන විටත් නිම කර නොතිබුණු අතර, මෙම ව්‍යාපෘති වර්ෂ 01 සිට 04 දක්වා වූ කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි.

(ඊ) රු. 233,470,043ක් වටිනා අයිතමයන් ප්‍රසම්පාදන කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර තිබුණු නමුත්, සාමාලෝචිත වර්ෂයේ දී එයින් රු. 28,342,689 හෝ 12% වටිනා වත්කම් පමණක් ප්‍රසම්පාදනය කර තිබුණි. එබැවින් කාර්යාංශයේ සැබෑ අවශ්‍යතාවයන් සැලකිල්ලට නොගෙන තාර්කික නොවන පදනමින් ප්‍රසම්පාදන සැලැස්මක්  පිළියෙල කර තිබූ බව නිරීක්ෂණය විය.

(උ) විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ කාල විශ්ලේෂණයට අනුව, ගෙවන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, තැම්පතු, අනෙකුත් අත්තිකාරම් සහ විවිධ ණයගැතියන් වැනි එකතුව රු. 414,258,947ක් සහ රු.19,932,930ක ලැබිය යුතු ශේෂ 2019 දෙසැම්බර් 31 වන දින වන විටත් පිළිවෙලින් අවුරුදු 03කට සහ අවුරුදු 05කට වැඩි කාලයකින් හිඟහිට් වී තිබුණි. කෙසේ වෙතත් වගකිව යුතු නිලධාරීන් මෙම ශේෂ නිසි කලට අය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නො තිබුණි.

(ඌ) සංචාරක නිල නිවාස 03ක් කොත්මලේ, රන්දෙනිගල හා පොළොන්නරුවෙහි පිහිටා තිබුන ද, එම සංචාරක නිවාස වල නවාතැන් ගන්නා නිලධාරීන් සඳහා ලේඛනයක් පවත්වා ගැනීමටත් එම නිවාස වෙන් කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් කාර්යය පටිපාටි ක්‍රියාත්මක කිරීමටත් කාර්යංශය කටයුතු කර නො තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ ඉහත නිවාස 3න් නිවාස 02කින් රු. 50,750ක කුලී ආදායමක් පමණක් උපයා ගෙන තිබුණි.

(ඩ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද 2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාවට අනුව, කාර්යාංශයේ අංශ 07කට අයත් ඇස්තමේන්තුගත වටිනාකම රු. 19,700,000ක් වූ ඉලක්කගත ක්‍රියාකාරකම් 21ක් සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් වාර්තා වී නැත. මෙම තත්වය කාර්යාංශයේ සමස්ථ කාර්ය සාධනයට අහිතකර ලෙස බලපා ඇත.

(ඪ) කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂ ව තනතුරු 12ක් සඳහා අතිරික්ත සේවකයින් 231 දෙනෙකු කාර්යාංශය විසින් බඳවා ගෙන තිබුණු අතර මෙම අතිරික්ත බඳවා ගැනීමේ අවශ්‍යතාවය විගණනයට පැහැදිලි කර නො තිබුණි. තවද, 2018 ජූලි 18 වන දිනැති හා අංක 03/2018 දරණ කළමනාකරණ සේවා චක්‍රෙල්ඛය මඟින් ඉල්ලා ඇති පරිදි මෙම අතිරික්ත සේවක පිළිබඳ තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා නො තිබුණි.

(ඹ) ඉහත කරුණු වලට අමතර ව කාර්යාංශය විසින් 2017 ජූලි සිට 2019 පෙබරවාරි දක්වා කාලය තුල මිනිස්බල සැපයුම් සමාගමකින් සේවකයින් 158 දෙනෙකු ලබා ගෙන තිබුණු අතර 2019 වර්ෂයේ දී වැටුප්, අතිකාල සහ සේවා ගාස්තු ලෙස රු. 98,214,017ක් එම සමාගමට ගෙවා තිබුණි.

(ඕ ) කාර්යංශය සමඟ එළඹි බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කරන ලද නිලධාරීන් 15 දෙනෙකුගෙන් රු. 10,617,637ක් වූ පාඨමාලා ගාස්තු අයකර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණු අතර, 2019 දෙසැම්බර් 31 වන විට මෙම ශේෂ වර්ෂ 01 සිට 06 දක්වා කාල සීමාවක් තුළ හිඟහිටි වී පැවතුණි. ඉහත මුදලින් රු. 6,615,610ක් 2005 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය තුළ වැටුප් රහිත නිවාඩු මත විදේශගත වූ නිලධාරීන් 07 දෙනෙකුට ගෙවා තිබුණු බව තව දුරටත් නිරීක්ෂණය විය.

(ක) රු. 2,567,532ක මුදලක් කිසිදු අරමුණක් සඳහා භාවිතයට නො ගෙන පසුගිය වර්ෂ 03ක කාලයක් තිස්සේ ක්‍රියාත්මක නොවන (අක්‍රීය) බැංකු ජංගම ගිණුම් හතක රඳවාගෙන තිබුණු අතර මෙම ශේෂ 2020 ජුනි 30වන විටත් වෙනස් නොවී පැවතුණි.

(ග) 2019 දෙසැම්බර් 31 දිනට සමස්ථ වෙළඳ ණයගැති ශේෂය රු. 6,522,955,552කි. එයින් එකතුව රු. 1,959,938,392ක් සහ රු. 1,351,038,777ක් වූ ශේෂ 2019 දෙසැම්බර් 31 දින වන විටත් පිළිවෙලින් වසර 03ක් සහ වසර 05කට වැඩි කාලයක් තිස්සේ හිඟහිට වී තිබුණු අතර මෙම වාර්තාවේ දිනය දක්වා ද එම ශේෂ අයකර ගෙන නො තිබුණි.

(ජ) 2019 දෙසැම්බර් 31 දිනට අවුරුදු 03ක් සහ අවුරුදු 05කට වැඩි කාලයක් තිස්සේ පැවති පිළිවෙලින් රු.732,414,526ක් සහ රු.489,531,173ක නිම කරන ලද හෝ අත්හිටුවන ලද ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල ව ලැබිය යුතු රඳවා ගැනීම් අය කර ගැනීම් පිළිබඳ විගණනයේ දී සාධාරණ සැකයක් මතු වී තිබුණි. තව ද, මෙම වාර්තාවේ දිනය දක්වා ම එම ශේෂයන් කිසිදු වෙනස් වීමකින් තොරව පැවතුණි.

(ට) මූලික කාර්යාල 02කින් සම්පූර්ණයෙන් නිම කරන ලද සහ අත්හිටුවන ලද ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාල ව ලැබී තිබූ රු. 19,889,526 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පියවීමකින් තොර ව 2019 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම්වල පැවතුනි. මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට ඇති හැකියාව හඳුනා ගැනීම සඳහා පසු විපරම් ක්‍රියාවලියක් සිදු කිරීමට කාර්යංශය අපොහොසත් වී තිබුනු බව තව දුරටත් නිරීක්ෂණය විය.

(ඩ) විගණනය වෙත ඉදිරිපත් කර තිබූ කාල විශ්ලේෂණයට අනුව, රු. 358,779,468 සහ රු. 586,044,360ක ණය හිමියන් හා

රු. 680,283,735 සහ රු. 83,390,570ක ගෙවිය යුතු රඳවා ගැනීම් පිළිවෙලින් අවුරුදු 03 සිට අවුරුදු 05 අතර කාලය තුලදී හා අවුරුදු 5ට වැඩි කලක් තිස්සේ පියවා නො තිබුනි. තවද රු. 13,324,743ක උපචිත වියදම් අවුරුද්දකට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් කිරීමකින් තොර ව හිඟහිටිව පැවතුණි.

(ණ) රු. 872,100,313 මුදලක් ගෙවිය යුතු ආදයම් බදු ලෙස දක්වා තිබුනි. මෙයින් එකතුව රු. 441,249,851ක් සහ රු. 151,337,445ක මුදල් පිළිවෙලින් අවුරුදු 03කට සහ අවුරුදු 05කට වැඩි කාලයක් තිස්සේ දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නො තිබිණි. මෙම ක්‍රියාවලිය 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානවලට හා ඒ සඳහා කරන ලද සංශෝධනවලට පටහැනි බව තව දුරටත් නිරීක්ෂණය විය.

(ත) සරණ මාවතෙහි පිහිටි නිල නිවාස හයක් 2004 වර්ෂයේ සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තිදෙනෙකුට හා එවකට මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් (2019 ජුනි 09 දින විශ්‍රාම ගන්නා ලදි.) මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ එවකට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශයේ ලේකම් වෙත ලබා දී තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් අදාල පාර්ශව හා කාර්යාංශ අතර කිසිඳු ගිවිසුමකට එළඹී නො තිබුණු අතර මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශයේ ලේකම්ගේ කිසිඳු බදු කුලියක් අයකර ගෙන නො තිබුණි. තව ද, විගණනය සඳහා ලබා දී තිබුණු තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ දී බදු කුලී ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 03 දෙනෙකුගෙන් රු. 741,154ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ද) සියළුම ආකාරයේ ඉදිකිරීම් කටයුතු සහ ඉංජිනේරු උපදේශක කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය සියලු භෞතික හා මානව සම්පත් වලින් කාර්යාංශය සමන්විත වුව ද, වර්තමානයේදී කාර්යාංශය විසින් ලබා ගන්නා සියලු ඉදිකිරීම් කොන්ත්‍රාත්තු, එම කොන්ත්‍රාත්තු මිල මත 2.5%ක ලාභ ආන්තිකයක් සහිත ව එකී පරිපාලිත සමාගම (CESL) වෙත උප කොන්ත්‍රාත්තු ලෙස ලබා දී තිබුණි. ඒ පරිදි, සමාලෝචිත වර්ෂයේ දී පමණක් රු. මිලියන 4,552.64ක් වටිනා ව්‍යාපෘති 47ක් රු. මිලියන 135.62ක ලාභයක් රඳවා ගැනීමෙන් පසු එකී පරිපාලිත සමාගම වෙත උප කොන්ත්‍රාත්තු ලෙස ලබා දී තිබුණි. කෙසේ වෙතත්, සේවාදායකයින් සමඟ ගිවිසුම්වල හෙලිදරවු කර නො තිබුණු බව නියදී විගණන පරීක්ෂාවේ දී අනාවරණය විය.

(න) කාර්යාංශයේ හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයාගේ අවමංගල්‍ය වියදම් සඳහා රු. 613,360ක මුදලක් ගෙවීමට 2019 ඔක්තෝම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. එම මුදලින් රු. 138,360ක චෙක්පතක් කාර්යාංශයේ නමට ලියාගෙන තිබුණි. මෙම වියදම කාර්යාංශයේ කටයුතුවලට අදාල නීත්‍යානුකූල පිරිවැයක් නො වුව ද, එය 2003 ජුනි 02 දිනැති හා අංක PED 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනි ව පරිපාලන වියදම් යටතේ දක්වා තිබුණි.

(ප) මුල්‍ය ප්‍රකාශනවලට අනුව තොග වටිනාකම රු. 10,741,039ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, ලෙජරයේ ශේෂයන් සහ විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු අනුව, සත්‍යාපිත තොග ශේෂය රු. 7,859,343ක් පමණකි. එබැවින් රු. 2,881,695ක හඳුනාගත් තොග අලාභයක් විගණනයේ දී නිරීක්ෂණය විය.

(බ) විගණනය සඳහා ලබා දී තිබූ තොරතුරුවලට අනුව, 2019 වර්ෂය තුළ දී අවස්ථා 24ක දී වාහන 22ක් අනතුරු වලට ලක්ව තිබූ අතර, අනතුරට ලක්වූ වාහන 17ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.1,025,508ක් වැය කර තිබුණි. කෙසේ වුව ද, අනතුරු වලට ලක්වූ වාහන 7ක් සඳහා වූ අළුත්වැඩියා කිරීම් පිරිවැය පිළිබඳ විස්තර විගණනය වෙත ලබා දී නො තිබුණි. තව ද, අලාභයේ ප්‍රමාණය හා හේතු සොයා බලා වගකිව යුතු පුද්ගලයින්ට වගකීම් පැවරීම සඳහා කිසිඳු පරීක්ෂණයක් පවත්වා නො තිබුණි. තව ද, මෙම වාහන අනතුරු සම්බන්ධයෙන් මූලික වාර්තා සහ අවසන් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නො තිබුණි.

# සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශන

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2015 | | 2016 | | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සමූහය | ඉ.කා.ම.උ.කා | සමූහය | ඉ.කා.ම.උ.කා | සමූහය | ඉ.කා.ම.උ.කා | සමූහය | ඉ.කා.ම.උ.කා | සමූහය | ඉ.කා.ම.උ.කා |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආදායම | 11,423,636,967 | 10,710,472,734 | 11,674,570,503 | 10,333,280,821 | 15,209,624,006 | 13,195,637,498 | 14,273,155,936 | 9,667,271,046 | 13,150,718,975 | 7,548,165,387 |
| විකුණුම් පිරිවැය | (9,679,902,097) | (9,448,860,733) | (9,853,816,338) | (9,179,818,923) | (13,312,355,493) | (12,075,714,656) | (12,408,766,802) | (8,620,274,575) | (11,764,257,425) | (6,971,370,106) |
| **දළ ලාභය** | **1,743,734,870** | **1,261,612,002** | **1,820,754,165** | **1,153,461,898** | **1,897,268,513** | **1,119,922,842** | **1,864,389,134** | **1,046,996,471** | **1,386,461,550** | **576,795,281** |
| වෙනත් ආදායම් | 168,515,920 | 173,393,789 | 218,971,425 | 272,930,388 | 134,210,273 | 179,759,198 | 194,774,284 | 156,941,619 | 202,839,680 | 170,110,297 |
| පරිපාලන වියදම් | (1,142,902,688) | (773,676,196) | (1,151,207,809) | (601,403,438) | (1,395,814,503) | (718,018,736) | (1,474,518,729) | (689,012,073) | (1,451,346,051) | (668,489,960) |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | (222,249,855) | (220,503,209) | (222,937,513) | (213,573,602) | (140,237,585) | (131,766,570) | (282,120,820) | (279,559,063) | (52,706,532) | (48,715,865) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබීම් | **547,098,247** | **440,826,385** | **665,580,269** | **611,415,245** | **495,426,698** | **449,896,734** | **302,523,870** | **235,366,954** | **85,248,647** | **29,699,753** |
| මූල්‍ය ආදායම | 168,766,491 | 150,007,977 | 282,598,968 | 210,668,182 | 445,958,333 | 316,507,931 | 453,739,544 | 303,565,802 | 506,143,480 | 314,400,265 |
| මූල්‍ය ගාස්තු | (16,207,048) | (8,789,218) | (22,135,246) | (6,263,475) | (26,342,723) | (9,753,126) | (56,980,423) | (12,740,273) | (44,602,963) | (4,162,901) |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | **152,559,443** | **141,218,758** | **260,463,722** | **204,404,707** | **419,615,611** | **306,754,804** | **396,759,121** | **290,825,529** | **461,540,517** | **310,237,364** |
| ආදායම් බදු පෙර ලාභය | 699,657,690 | 582,045,143 | 926,043,990 | 815,819,952 | 915,042,308 | 756,651,538 | 699,282,990 | 526,192,483 | 546,789,164 | 339,937,117 |
| ආදායම් බදු | (287,358,436) | (250,935,705) | (401,823,227) | (376,156,549) | (392,859,134) | (355,346,282) | (173,485,949) | (121,848,247) | (201,424,594) | (136,038,213) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | 412,299,253 | 331,109,438 | 524,220,763 | 439,663,403 | 522,183,174 | 401,305,256 | 525,797,041 | 404,344,237 | 345,364,570 | 203,898,904 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | 13,927,098 | 13,927,098 | 20,297,204 | 20,282,110 | (6,529,540) | (5,919,064) | 105,985,482 | 106,668,588 | 306,787,948 | 307,144,855 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **426,226,351** | **345,036,536** | **544,517,967** | **459,945,513** | **515,653,634** | **395,386,192** | **631,782,523** | **511,012,824** | **652,152,518** | **511,043,759** |

(වරහන් තුල ඇති අගයන්ගෙන් අඩු කරීමේ පෙන්නුම් කෙරේ)

# සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

දෙසැම්බර් 31 වන දිනට

| | 2015 | | 2016 | | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සමූහය | ඉ.කා.ම.උ.කා | සමූහය | ඉ.කා.ම.උ.කා | සමූහය | ඉ.කා.ම.උ.කා | සමූහය | ඉ.කා.ම.උ.කා | සමූහය | ඉ.කා.ම.උ.කා |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | | | | |
| දේපල,පිරියත හා යන්ත්‍රෝපකරණ | 3,088,678,195 | 2,686,829,682 | 2,905,911,035 | 2,509,023,699 | 2,852,702,138 | 2,372,710,383 | 2,823,088,623 | 2,387,873,408 | 3,231,130,105 | 2,773,136,175 |
| කල්බදු වත්කම් | - | - | - | - | - | - | 74,948,240 | 74,948,240 | 87,598,676 | 72,422,750 |
| අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - | - | - | 8,574,369 | 8,574,369 | 7,642,750 | 7,642,750 |
| ආයෝජන | 39,477,863 | 44,253,587 | 38,489,824 | 46,957,402 | 51,117,849 | 61,117,869 | 52,634,700 | 62,634,720 | 55,216,573 | 65,216,593 |
| විලම්භිත බදු | - | - | - | - | - | - | - | 25,274,627 | - | - |
| **මුළු ජංගම නොවන වත්කම්** | **3,128,156,058** | **2,731,083,269** | **2,944,400,859** | **2,555,981,101** | **2,903,819,986** | **2,433,828,252** | **2,959,245,932** | **2,559,305,364** | **3,381,588,105** | **2,918,418,269** |
| **ජංගම වත්කම්** | | | | | | | | | | |
| ඉන්වෙන්ටරි | 594,682,065 | 92,491,334 | 785,057,154 | 16,857,933 | 832,849,205 | 10,638,501 | 756,031,502 | 10,727,067 | 737,855,759 | 10,741,039 |
| සිදු කෙරෙමින් පවතින කාර්යන් | - | - | - | - | - | - | 458,346,685 | - | 79,938,521 | - |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 8,937,778,990 | 9,443,009,084 | 11,485,838,621 | 11,013,443,138 | 14,779,002,414 | 14,400,921,345 | 12,092,206,764 | 11,485,297,537 | 13,357,590,461 | 11,741,494,084 |
| කෙටි කාලීන ආයෝජන | 3,341,850,862 | 2,570,978,949 | 4,081,356,846 | 3,035,639,354 | 4,094,534,947 | 2,983,463,922 | 5,176,600,458 | 3,191,494,525 | 4,868,452,606 | 3,108,471,017 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 801,392,970 | 622,427,835 | 648,439,480 | 440,730,586 | 691,640,433 | 461,781,166 | 865,760,048 | 537,695,214 | 568,539,381 | 257,291,253 |
| අන්තර් සමාගම් ජංගම ගිණුම් | - | 1,147,466,029 | - | 1,371,069,905 | - | 1,565,621,738 | - | 1,588,871,719 | - | 1,600,196,674 |
| **මුළු ජංගම වත්කම්** | **13,675,704,887** | **13,876,373,232** | **17,000,692,101** | **15,877,740,916** | **20,398,026,999** | **19,422,426,671** | **19,348,945,457** | **16,814,086,063** | **19,612,376,729** | **16,718,194,067** |
| **මුළු වත්කම්** | **16,803,860,945** | **16,607,456,501** | **19,945,092,960** | **18,433,722,017** | **23,301,846,985** | **21,856,254,923** | **22,308,191,389** | **19,373,391,428** | **22,993,964,834** | **19,636,612,336** |
| **සමකොටස් හා බැරකම්** | | | | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 |
| ප්‍රාග්ධන සංචිත | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 122,414,358 | 122,414,357 | 606,345,300 | 606,345,300 |
| රඳවා ගත් ඉපැයීම | 4,952,476,935 | 4,744,367,819 | 5,496,994,903 | 5,204,313,332 | 6,012,648,538 | 5,599,699,524 | 6,086,973,711 | 5,675,860,567 | 6,234,940,310 | 5,640,074,835 |
| **මුළු සමකොටස්** | **4,956,004,935** | **4,747,895,819** | **5,500,522,903** | **5,207,841,332** | **6,016,176,538** | **5,603,227,524** | **6,209,888,069** | **5,798,774,925** | **6,841,785,609** | **6,246,920,134** |
| **ජංගම නොවන බැරකම්** | | | | | | | | | | |
| කල් බදු ණය හිමියන් | - | - | - | - | - | - | - | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 177,457,833 | 176,438,911 | 158,063,895 | 156,587,664 | 165,820,347 | 161,242,343 | 176,869,571 | 168,341,721 | 180,974,438 | 167,903,375 |
| විලම්භිත බදු | 17,617,814 | - | 21,820,955 | - | 22,581,183 | - | 6,887,518 | - | 200,932,489 | 159,166,864 |
| **මුළු ජංගම නොවන බැරකම්** | **195,075,647** | **176,438,911** | **179,884,851** | **156,587,664** | **188,401,530** | **161,242,343** | **183,757,088** | **168,341,721** | **381,906,927** | **327,070,239** |
| **ජංගම බැරකම්** | | | | | | | | | | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 10,877,454,823 | 10,931,756,058 | 13,293,081,842 | 12,120,903,654 | 16,124,875,069 | 15,156,893,565 | 14,909,461,179 | 12,479,623,765 | 14,888,563,947 | 12,190,521,650 |
| ගෙවිය යුතු ආදායම් බදු | 774,441,715 | 751,365,709 | 971,603,364 | 948,389,368 | 972,393,849 | 934,891,491 | 974,665,375 | 926,651,017 | 881,708,352 | 872,100,313 |
| කල්බදු ණය හිමියන් | 883,827 | - | - | - | - | - | - | - | - | - |
| බැංකු අයිරා | - | - | - | - | - | - | 30,419,679 | - | - | - |
| **මුළු ජංගම බැරකම්** | **11,652,780,363** | **11,683,121,770** | **14,264,685,206** | **13,069,293,022** | **17,097,268,918** | **16,091,785,056** | **15,914,546,232** | **13,406,274,781** | **15,770,272,298** | **13,062,621,963** |
| **මුළු බැරකම්** | **11,847,856,010** | **11,859,560,681** | **14,444,570,057** | **13,225,880,686** | **17,285,670,447** | **16,253,027,399** | **16,098,303,321** | **13,574,616,502** | **16,152,179,226** | **13,389,692,201** |
| **මුළු සමකොටස් හා බැරකම්** | **16,803,860,945** | **16,607,456,501** | **19,945,092,960** | **18,433,722,017** | **23,301,846,985** | **21,856,254,923** | **22,308,191,389** | **19,373,391,428** | **22,993,964,834** | **19,636,612,336** |

## CECB හි කාර්ය සාධනය

### මේ දක්වා පැමිණි ගමන් මග

- ජල සම්පත් සහ ජල විදුලි ව්‍යාපෘති පිළිබඳ විශේෂඥයෙකු ලෙස 1973 වසරේ දී අපගේ ගමන ආරම්භ විය.
- මහවැලි කඩිනම් වැඩසටහන අවසන් කිරීමෙන් පසු අපි ඉදිකිරීම් උපදේශක අංශය විවිධාංගීකරණය කළෙමු.
- මානව ප්‍රාග්ධනයට ජාත්‍යන්තර ප්‍රවේශයක් ලබා දෙමින් විදේශ ව්‍යාපෘති සිදු කිරීම සඳහා CECB ආයතනය සිය අංශයන් දේශසීමාවෙන් ඔබ්බට තවදුරටත් පුළුල් කරන ලදී.
- 2016 වර්ෂයේදී CECB ආයතනය ඉදිකිරීම් ව්‍යාපාරයෙන් ඉවත් වීමට උපායමාර්ගික තීරණයක් ගත් අතර, එම කාර්යය එහි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන මධ්‍යම ඉංජිනේරු සේවා (CESL) පෞද්ගලික සමාගම වෙත පැවරීමට කටයුතු කළේය.
- වර්තමානයේදී, CECB ආයතනය රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවාදායකයින් සඳහා අංගසම්පූර්ණ ඉංජිනේරු උපදේශකත්ව සහ සම්බන්ධිත සේවා සපයන්නෙකු ලෙස ක්‍රියා කරනු ලැබේ.

### ප්‍රධාන අංශ



## 2019 දෙසැම්බර් අවසානය දක්වා වූ ජයග්‍රහණ

| | |
|---|---|
| 2019 වර්ෂයේ භාරගන්නා ලද<br>නව උපදේශන ව්‍යාපෘති සංඛ්‍යාව - 120<br>උපදේශන සේවාවල මුළු වටිනාකම<br>රු. මිලියන 1,053 | 2019 වර්ෂයේ නිමකරන ලද<br>නව උපදේශන ව්‍යාපෘති සංඛ්‍යාව - 99<br>උපදේශන සේවාවල මුළු වටිනාකම<br>රු. මිලියන 836 |

## ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති

**කළු ගඟ ජලාශය**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 14,250 කි
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 100%





**උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 71,400
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 70%





**බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 11,000
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 77%





# ගොඩනැගිලි ව්‍යාපෘති

**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ ව්‍යාපෘතිය**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 55,000.
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 59%





**මැනිං වෙළඳපොළ ප්‍රති ස්ථානගත කිරීම**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 4,260.
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 95%





**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 2,515.
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය 100%



**සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 5,979.
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 50%



## ගොඩනැගිලි ව්‍යාපෘති

**නැනෝ තාක්ෂණ මධ්‍යස්ථානය**
**නැනෝ තාක්ෂණ සහ විද්‍යා උද්‍යානය**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 1,400
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 54%



**නීතිපති දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 960
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 87%



**රත්නපුර උසාවි සංකීර්ණය සඳහා මහල් 5 ක ගොඩනැගිල්ල**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 1,800
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 13%



**ශ්‍රී ලංකාව සඳහා මහල් 17ක නව කාර්යාල ගොඩනැගිල්ල සහ ශිල්පශාලා 04 වරාය අධිකාරිය** (SLPA)
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 4,274
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 41%



**සෙත්සිරිපායේ බහු මහල් කාර්යාල සංකීර්ණය පරිශ්‍රය (සෙත්සිරිපාය - අදියර 3)**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 15,600
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 40%



**ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය - කොළඹ 12**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 14,600.00



## පාලම්, අධිවේගී මාර්ග සහ දුම්රිය මාර්ග

**මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් බිලියන 40
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 86%





**දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය දිගු කිරීම**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 255,280
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 98%





**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය : රුපියල් මිලියන 137,340
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 81%





## යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

**කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය - යටිතල පහසුකම් සහ භූ දර්ශන වැඩ**
උපදේශකත්ව සේවාවල වටිනාකම: රුපියල් මිලියන 144,542
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 59%





## ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

**කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය - අරුවක්කලු**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 16,103
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 90%





## පූර්ව ශක්‍යතා සහ ශක්‍යතා අධ්‍යයනය

**ආලෝකය පිළිබඳ පූර්ව ශක්‍යතා සහ ශක්‍යතා අධ්‍යයනය**
**සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය (LRT)**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 202.47
2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද ප්‍රමාණය: 100%



**ශක්‍යතා අධ්‍යයනය සහ ටෙන්ඩර් අදියර නිර්මාණය සඳහා**
**මෙගාවොට් 20 සීතාවක ගංගා ජල විදුලිය ව්‍යාපෘතිය (SGHPP)**
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 12,000



# CECB මූල්‍ය කාර්ය සාධනය

බහු- ක්ෂේත්‍ර ඉංජිනේරු විද්‍යාවේ රාජ්‍ය අංශයේ වෙනසක් ඇති කිරීමේ නියෝජිතයෙකු බවට අප කාර්යාංශය පත්වෙමින් පවතින බව පැහැදිලිය. එමෙන්ම ඕනෑම හදිසි අවදානම් තත්ත්වයක් කඩිනමින් හැසිරවීමේ හැකියාව ඇති රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස ප්‍රසිද්ධියට පත්ව තිබේ. වෙනත් වචන වලින් කිවහොත්, විවිධ ඉංජිනේරු විෂයයන් නියෝජනය කරන බහු-ක්ෂේත්‍ර වෘත්තිකයන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයකින් සමන්විත ශක්තිමත් මානව සම්පත් පදනමක් ඇති එකම රාජ්‍ය අංශයේ ඉංජිනේරු ආයතනය මෙය වේ. ආයතනයක් ලෙස 'ඉංජිනේරුකරණයෙන් ඔබ්බට' විසඳුම් සෙවීමට අපගේ සංවිධානය පුහුණු කර ඇති අතර සේවය සඳහා කැප වූ ප්‍රතිඵල ඉලක්ක කරගත් කණ්ඩායමක් ලෙස CECB ආයතනය ක්‍රියා කරයි. අප කණ්ඩායම ප්‍රධාන කණ්ඩායම් දෙකකින් සමන්විත වේ. එනම් තාක්ෂණික / ඉංජිනේරු කාර්ය මණ්ඩලය සහ තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලය වේ. සිය ක්ෂේත්‍රවල පුළුල් පරාසයක පළපුරුදක් සහ කුසලතා ඇති පැරා තාක්ෂණික, තාක්ෂණික සහ ලේකම් කාර්ය මණ්ඩලයකින් මෙම කණ්ඩායම සමන්විත වේ.

2019 වසරේ CECB සමූහයේ ආදායම රුපියල් බිලියන 13.1 ක් වූ අතර එය පෙර වසරේ ආදායමට වඩා 8% ක අඩුවීමක් පෙන්නුම් කරයි. CECB ආදායම පෙර වසර හා සසඳන විට 22% කින් සහ දළ ලාභය 44% කින් අඩු වී ඇත්තේ ප්‍රධාන වශයෙන් සියලුම ඉදිකිරීම් කටයුතු CECB විසින් පූර්ණ හිමිකාරීත්වය දරන මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්.) සමාගම වෙත පවරා තිබීම හේතුවෙනි.

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සහ සමූහයේ මෙහෙයුම්වල ප්‍රතිඵලයක් ලෙස 2019 වර්ෂය සඳහා බදු පසු ලාභය පිළිවෙළින් රුපියල් මිලියන 204ක් සහ රුපියල් මිලියන 345ක් වූ අතර, පෙර වර්ෂයේ බදු පසු ලාභය රුපියල් මිලියන 404ක් සහ රුපියල් මිලියන 525ක් විය. කාර්යාංශයේ මුළු වත්කම් වටිනාකම රු. මිලියන 19,636 ක් වන අතර ලාභය, කාර්යාංශයේ මුළු වත්කම්වලින් 1% ක් නියෝජනය කරයි.

ස්වයං ඉපැයීම් රාජ්‍ය ව්‍යවසායයක් (SOE) ලෙස කාර්යාංශය මුහුණ දෙන ආයතනික සීමාවන් සැලකිල්ලට ගැනීමේදී, රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මූල්‍ය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ක්‍රියා පටිපාටිවලට නිසි ලෙස අනුකූල වෙමින් ලබාගත් මෙම මෙහෙයුම් සහ මූල්‍ය කාර්ය සාධනය වඩාත් වැදගත් වේ.

**ආදායම - සමූහයට එරෙහිව ඉ.කා.ම.උ.කා**




**දළ ලාභය - සමූහයට එරෙහිව ඉ.කා.ම.උ.කා**



## විශේෂඥ ක්ෂේත්‍ර සහ සේවා

- ගොඩනැගිලි සේවා
- රෝහල් සංවර්ධනය
- ගෘහ නිර්මාණ සේවා
- ව්‍යුහාත්මක සැලසුම්
- ප්‍රමාණ සමීක්ෂණය
- මාර්ග සහ පාලම්
- දුම්රිය මාර්ග කාර්යයන්
- වරාය/ වෙරළබඩ කාර්යයන්
- ගුවන්තොටුපළ සංවර්ධනය
- ජල සම්පාදන සහ ජලාපවහන
- ජල විදුලිය සහ බලශක්තිය
- බලශක්ති සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම
- ජල සම්පත් සංවර්ධනය
- තාක්ෂණික විගණනය / වේලි ආරක්ෂාව
- විදුලි හා යාන්ත්‍රික කාර්යයන්
- ඉඩම් මැනීම
- තොරතුරු තාක්ෂණය (IT)
- පරිසර අධ්‍යයනය
- ව්‍යාපෘති කළමනාකරණය
- භූ තාක්ෂණික විමර්ශන සහ රසායනාගාර සේවා



# මානව සම්පත්

කළමනාකරණ සහ රේඛීය අමාත්‍යාංශය විසින් නියම කර ඇති ක්‍රියාපටිපාටි අනුව යන ශක්තිමත් ආයතනික සංස්කෘතියක් මගින් අපගේ සේවකයින්ගේ කාර්ය සාධනය සහ හැසිරීම පාලනය වන සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට කාර්යාංශය කැපවී සිටී.

ඉදිකිරීම්, සාමූහික තීරණ ගැනීම, සේවකයින්, සේවකයන් කෙරෙහි මිත්‍රශීලී නමුත් ස්ථිර ආකල්පයක් පවත්වාගෙන යාම, සේවක සුභසාධනය සහ වර්ධනය සහ අවිධිමත් ආයතනික පරිසරය යන උපදේශකත්වය ලබා දීමේ සෑම අංශයකින්ම සහ සෑම අදියරකදීම ගුණාත්මක භාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීම යන සංකල්පය වටා CECB හි සංස්කෘතිය කේන්ද්‍ර ගතව තිබේ. අපගේ සේවා ස්ථාන ප්‍රතිපත්තිය මගින් සේවකයන්ගේ දුක්ගැනවිලිවලට සහන සලසමින් ඔවුන්ගේ සුභසාධනය සලසන අතරම, වෙනස් කොට සැලකීම් සහ හිරිහැරවලින් තොර ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා ස්ථානයක ඔවුන්ගේ කාර්යය විශිෂ්ඨ ලෙස ඉටු කිරීමට හැකියාව ලබා දී තිබේ.

## ශ්‍රම බලකාය - 2019




| | ස්ථිර | කොන්ත්‍රාත් | රැකියා කොන්ත්‍රාත් |
|---|---|---|---|
| තාක්ෂණික | 798 | 59 | 141 |
| තාක්ෂණික නොවන | 220 | 31 | 111 |

2019 සම්පූර්ණ ශ්‍රම බලකාය - 1360

2018 වර්ෂයේදී කාර්යාංශයේ මුළු සේවක සංඛ්‍යාව 1446ක් වූ අතර පසුගිය වසරට සාපේක්ෂව 6% කින් අඩුවීමක් පෙන්නුම් කෙරෙන අතර, 2019 වර්ෂයේදී අපගේ ස්ථිර සේවක මණ්ඩලයට සේවකයින් 55ක් බඳවා කාර්යාංශය සමත් වී ඇත.

සාමාන්‍යාධිකාරීවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ කාර්යාංශයේ මානව සම්පත් ඒකකය ක්‍රියාත්මක වන අතර කාර්යාංශයේ සිදුවන සියලුම මානව සම්පත් කාර්යයන් සඳහා එමගින් වගකීම දරනු ලැබේ. විධිමත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් මගින් කෙරෙන ක්‍රියාපටිපාටි මගින් සේවක වෘත්තීය සංවර්ධනය, ආරක්ෂාව සහ අයිතිවාසිකම් ආරක්ෂා කෙරේ.

විධිමත් ප්‍රතිපත්ති රාමු, රජය විසින් සකසා ඇති ක්‍රියා පටිපාටිවලට අනුකූලව වන අතර එමගින් බඳවා ගැනීම්, රජයේ මාර්ගෝපදේශ මගින් ලබා දී ඇති ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) මත පදනම්ව කාර්ය සාධන ඇගයීම, පැමිණිලි හැසිරවීම, පුහුණුව හා සංවර්ධනය සහ වන්දි ගෙවීම ආවරණය කරනු ලැබේ.

CESL

# මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්.) සමාගම

"1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2003 වර්ෂයේ දෙසැම්බර් මස 16 වැනි දින සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කර ඇති ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට (ඉකාමඋකා) පූර්ණ වශයෙන් අයත් පරිපාලිත සමාගමක් වන මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගම (මඉසේස) එහි ඉදිකිරීම් අංශය ලෙස කටයුතු කරන අතර 2009 වර්ෂයේ නොවැම්බර් මස 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත."

මෙම කාලපරිච්ඡේදයේදී ඇති වූ විශාල පිබිදීමේ ප්‍රතිඵලයක් ලෙස ඉදකිරීමේ සේවාවන් සඳහා වූ අධික ඉල්ලුම මගින් ඇති කරන ලද අවස්ථාව ප්‍රයෝජනයනට ගනිමින් 2011 වර්ෂයේ ආරම්භයේදී මඉසේස ඉදිකිරීම් කර්මාන්තයේ ක්‍රියාකාරීව මෙහෙයුම් ආරම්භ කරන ලදී. ඉකාමඋකා සමඟ එක්ව කටයුතු කිරීම තුළින් ඉදිකිරීම් කළමනාකරණය සහ තාක්ෂණික දැනුම මෙන්ම එහි ව්‍යාපෘති කළමනාකරණ දැනුම් හැකියාවද ලබා ගනිමින් කර්මාන්තය විසින් පිරිනමන ලද අභියෝගය මඉසේස විසින් භාර ගන්නා ලදී. මඉසේසහි ප්‍රධාන ව්‍යාපාර වන්නේ ගොඩනැගිලි, මාර්ග, පාලම්, ජල සම්පාදන ව්‍යූහ ඉදිරීම සහ වෙනත් සම්බන්ධිත යටතල ව්‍යූහ ඉදිකිරීම වේ. සමාගම, එහි ව්‍යාපෘති සඳහා කොන්ක්‍රීට් සහ ඇස්ෆාල්ට් නිෂ්පාදන කිරීමේදී යෙදී සිටී.

මඉසේස රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශ සේවාදායකයන් සඳහා සේවා සපයයි. සියලු ආකාරයේ ආයතනික ඉදිකිරීම් ව්‍යාපෘති නියමිත කාලයට සම්පූර්ණ කිරීම හේතුවෙන් මඉසේස රාජය නිලධාරීන්, ව්‍යාපාරික ප්‍රමුඛයන් සහ පාර්පාලකයන්ගේ විශ්වාසය දිනාගෙන ඇත. ඉකාමඋකා 1973 වැනි ඈත කාලයේදී උපදේශකවරුන් ලෙස ඉකාමඋකා පියස යටතේ මුලින්ම කර්මාන්තයට පිවිසීම තුළින් වර්තමානයේදී දැනුම් පදනමක් ලෙස ක්‍රියා කරන බොහෝ අත්දැකීම් ලබා ඇත. තවද ඉකාමඋකා හි EPC අංශය යටතේ ලබා ගන්නා ලද ඉදිකිරීම් අත්දැකීම් තිරසට ව්‍යාපාර වටපිටාවක් නිර්මාණනය කර ඇත.

## දැක්ම

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ අද්විතීය ආදර්ශය වීම

## මෙහෙවර

දායකත්වය ප්‍රමාණවත් ලෙස හඳුනාගන්නා ලද ඉහළ අභිප්‍රරණයක් සහිත කාර්ය මණ්ඩලයක් සමඟින් ඉදිකිරීම් තාක්ෂණයේ විශිෂ්ටත්වය සහ නවෝපාදනය අත්පත් කර ගැනීම

## ආයතනික අභිමතාර්ථ

- සියලු ක්‍රියාකාරි ක්ෂේත්‍ර සඳහා ඒකාබද්ධ සහ විනිවිදභාවයෙන් යුත් කළමනාකරණ පද්ධතියක් පවත්වා ගැනීම.
- අනන්‍ය තත්ත්ව, පරිසර, සෞඛ්‍ය සහ ආරක්ෂණ පද්ධතියක් පිහිටුවීම.
- විවිධාංගීකරණය කළ ආයෝජන මඟින් ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම.
- ඉදිකිරීම් කර්මාන්තයේ විශිෂ්ට මානව සම්පත් පදනමක් පවත්වා ගැනීම.
- ස්වාධීන ලාභ උපයන ආයතනයක් ලෙස CESL හි වත්කම් ඵලදායීව කළමනාකරණය කිරීම.
- ඉදිකිරීම් පිරිවැය ප්‍රශස්ත කිරීම පිණිස නවීන තාක්ෂණය භාවිතයෙන් පද්ධති වැඩිදියුණු කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීම.
- ප්‍රමාණවත් අත-ඇති වැඩ ප්‍රමාණයක් පවත්වා ගැනීම සහ ආයතනික තිරසරකත්වය සංවර්ධනය කිරීම.

# අධ්‍යක්ෂක මණ්ඩලය



**ඉංජි. පී.ඩී.ඒ. පියතිලක මහතා**
සභාපති
BSc.Eng. (Hons), PG.Dip. (Const.Mgt), PG.Dip. (Port & Coastal Eng.) Norway, MIE (SL), C.Eng., MASCE



**ඉංජි. එන්. රූපසිංහ මහතා**
අධ්‍යක්ෂ
BSc.Eng. (Hons), PG.Dip. (Hydropower) Norway, C.Eng., MIE (SL), MICE (London), Licd. Surveyor



**ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා**
විධායක අධ්‍යක්ෂ
BSc.Eng., C.Eng., MICE (UK), MIE (SL)



**ඉංජි. ටී.ඩී. වික්‍රමරත්න මහතා**
අධ්‍යක්ෂ
BSc.Eng. (Hons), M.Eng. PG.Dip. (Hydrology), MICE (UK), FIE (SL), C.Eng.



**ඉංජි. ඒ. ගල්කැටිය මහතා**
අධ්‍යක්ෂ
BSc.Eng., C.Eng, MIE (SL)



**ඉංජි. පී.ආර්.ඒ.එස් ගුණතිලක මහතා**
අධ්‍යක්ෂ
BSc.Eng. (Hons) Sri Lanko, MSc (Hydropower) Norway, MSc.(Struct) Sri Lanka, MIE(SL), C.Eng., MSSE (SL).

# ම.ඉ.සේ.ස විසින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති කිහිපයක්....




පොළොන්නරුව කෞතුකාගාරය සහ සම්පත් මධ්‍යස්ථානය



උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ රාගම (අදියර III) - හදිසි අනතුරු සේවා, ශල්‍යාගාර සංකීර්ණය, දැඩි සත්කාර ඒකකය සහ වාට්ටු



හිගුරක්ගොඩ ආනන්ද බාලිකා පාසල සඳහා පිහිනුම් තටාකය සහ මණ්ඩපය



ගිනිගත්හේන මධ්‍ය විද්‍යාලය ක්‍රීඩා පිටිය සංවර්ධනය



කදුරුවෙල දුම්රිය නිල නිවස



කළුතර පොදු වෙළඳපොල

# ම.ඉ.සේ.ස විසින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති කිහිපයක්....



විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා වූ “සත්සෙවන” රජයේ පුනරුත්ථාපන මධ්‍යස්ථානය, මීරිගම



රජයේ නිලධාරීන්ගේ නිල නිවාස සංකීර්ණය, පොළොන්නරුව



රුහුණු විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යා අංශය ( II අදියර )




පොළොන්නරුව මහ නගර සභා ගොඩනැගිල්ල



කල්මුණේ මූලික රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය



පොළොන්නරුව මහ නගර සභා ගොඩනැගිල්ල

## ප්‍රධාන කාර්යාලය

නො. 415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.
දුරකථන: +94 11 2668800
ෆැක්ස් : +94 11 2687369
විද්‍යුත් ලිපිනය : admin@cecbsl.com

## ප්‍රාදේශීය කාර්යාල

**බත්තරමුල්ල**
නො. 770/1, පන්නිපිටිය පාර, බත්තරමුල්ල
දුරකථන : 011 2873167, 011 4885433
ෆැක්ස් : 011 4405132
විද්‍යුත් ලිපිනය : ceslpvt@yahoo.com

**ගාල්ල**
අංක 20,ගොඩකන්ද පාර, කරාපිටිය, ගාල්ල.
දුරකථන : 091 4930935
Fax : 091 4381494, 091 4943882
විද්‍යුත් ලිපිනය: cecbsr.consultancy@gmail.com

**බදුල්ල**
37 / 2A, බණ්ඩාරනායක මාවත, බදුල්ල.
දුරකථන : 055 2222102,055 2224136
ෆැක්ස් : 055 2222102
විද්‍යුත් ලිපිනය : cecb_dgmuva@yahoo.com

**රත්නපුර**
31 - A / 60 , කොළඹ පාර, රත්නපුර.
දුරකථන : 045 2226766
ෆැක්ස් : 045 4405132
විද්‍යුත් ලිපිනය: ceslsab@yahoo.com

**අම්පාර**
ශ්‍රී රතන මාවත, අම්පාර.
දුරකථන : 063 2223240
ෆැක්ස් : 063 2222439
විද්‍යුත් ලිපිනය : cecbsoutheast@yahoo.com

**කන්තලේ**
ප්‍රියන්ත මාවත,කන්තලේ.
දුරකථන : 0262234357,0262234035
ෆැක්ස් : 0262234063
විද්‍යුත් ලිපිනය : cesl.east@gmail.com

**ගම්පහ**
ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, 3 වන මහල, මිරිස්වත්ත, ගම්පහ.
දුරකථන : 0332221173
ෆැක්ස් : 0332221173
විද්‍යුත් ලිපිනය : ceslgampaha@gmail.com

**කිලිනොච්චිය**
155 සැතපුම්කණුව, නුවර පාර, ඉරණමඩු, කිලිනොච්චිය.
දුරකථන: 021 2285486, 021 2283850
ෆැක්ස් : 021 2283850
විද්‍යුත් ලිපිනය : ceslnorth@gmail.com

**ජාවත්ත**
අංක 11, ජාවත්ත පාර,
කොළඹ 07.
දුරකථන : 011 5556239, 011 5744487, 011 5744497
ෆැක්ස් : 011 2505501, 011 5546239
විද්‍යුත් ලිපිනය: epcmah_cecb@yahoo.com

**අනුරාධපුර**
අංක 218 , යාපනය පාර, පුලියන්කුලම, අනුරාධපුර.
දුරකථන : 025 2226600, 025 2237268, 025 0037462
ෆැක්ස් : 025 2226282, 025 2234773
විද්‍යුත් ලිපිනය: ceslapura@gmail.com

**දිගන**
දිගන, රජවැල්ල.
දුරකථන : 081 2374349
ෆැක්ස් : 081 2374349
විද්‍යුත් ලිපිනය: cecbcentral@yahoo.com

**පොළොන්නරුව**
481/4/A, 28, කොළනිය, කුරුප්පු හංදිය, පොළොන්නරුව.
දුරකථන: 027 2054567
ෆැක්ස් : 027 3120118

**යාපනය**
155th සැතපුම් කණුව, නුවර පාර, ඉරණමඩු, කිලිනොච්චි.
දුරකථන: 021 2285486, 021 2283850
ෆැක්ස් : 021 2283850
විද්‍යුත් ලිපිනය : ceslnorth@gmail.com